# මානුෂීය ප්‍රතිචාරය හා බැඳුණු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පෞද්ගලික අංශය සඳහා වූ මූලික මානුෂීය ප්‍රමිතීන් පිළිබඳ මාර්ගෝපදේශය

## ශ්‍රී ලංකාව








DMC SRI LANKA

WFP World Food Programme

The Ceylon Chamber of Commerce

මෙම මාර්ගෝපදේශයේ ඉදිරිපත් කර ඇති මූලික මානුෂීය ප්‍රමිතීන් මූලික වශයෙන් පදනම් වී ඇත්තේ මූලික මානුෂීය ප්‍රමිති සන්ධානයේ පවතින මූලික මානුෂීය ප්‍රමිති මාර්ගෝපදේශය මත ය. මෙම ප්‍රමිතීන් දැනට කළමනාකරණය කරනු ලබන්නේ, එහි ඒකාබද්ධ ප්‍රකාශන අයිතිය හිමි Sphere, Core Humanitarian Standards Alliance සහ Groupe URD යන ආයතනය විසිනි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ ආපදා ප්‍රතිචාර කටයුතුවලට සම්බන්ධ පෞද්ගලික අංශයට වඩාත් සුදුසු වන පරිදි සමහර කැපවීම් නැවත සකස් කර ඇත. මූලික මානුෂීය ප්‍රමිතිය මුලින් සංවර්ධනය කරන ලද්දේ මානුෂීය අංශය විසින් Sphere, Core Humanitarian Standards Alliance, (HAP), People In Aid සහ Groupe URD යන ආයතනවල මූලික ප්‍රමිතීන් තනි රාමුවකට අනුකූල කිරීම සඳහා දරන ලද සාමූහික උත්සාහයක් හරහා ය. කැපවීම් නවයෙන් සෑම එකක්ම මානුෂීය ආපදා ආධාරවල විශේෂිත සැලකිලිමත් ක්ෂේත්‍රයක් ආමන්ත්‍රණය කරයි. එක්ව, එකි කැපවීම් හා වගකිවයුතු මානුෂීය ක්‍රියාමාර්ගයක නිරත වීමට පෞද්ගලික අංශයට ශක්තිමත් පදනමක් සහ ප්‍රවේශයක් සාදයි.

ලංකා වාණිජ මණ්ඩලය

50, නවම් මාවත, කොළඹ 02, ශ්‍රී ලංකාව

(0094) 11 5588800

(0094) 11 2437477, 2449352, 2381012

info@chamber.lk

අයිතිය අත් හැරීමේ ප්‍රකාශය / වියාචනය

සියලුම හිමිකම් ඇවිරිණි. මූලාශ්‍රය සම්පූර්ණයෙන්ම පිළිගෙන තිබේ නම්, අධ්‍යාපනික හෝ වෙනත් වාණිජ නොවන භාවිතයන් සඳහා මෙම තොරතුරු හෝ දැනුම ප්‍රතිනිෂ්පාදනය කිරීම සහ බෙදා හැරීම සඳහා ප්‍රකාශන හිමිකරුවන්ගේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව අවසර දෙනු ලැබේ. ලිඛිත අවසරයකින් තොරව නැවත විකිණීම හෝ වෙනත් වාණිජමය අරමුණු සඳහා මෙහි අඩංගු තොරතුරු ප්‍රතිනිෂ්පාදනය කිරීම තහනම්ය. එවැනි අවසරයක් සඳහා අයදුම්පත් WFP.Colombo@wfp.org වෙත යොමු කළ යුතුය. මූලාශ්‍රය වෙත යොමු කිරීම යන කොන්දේසිය මත WFP මෙම ප්‍රකාශනයේ අඩංගු ද්‍රව්‍ය බෙදා හැරීම දිරිමත් කරයි.

# පටුන


හැඳින්වීම ..... 01

පෞද්ගලික අංශයේ මානුෂීය උත්සාහයන් ..... 02

වචනාවලිය ..... 03

මාර්ගෝපදේශය පිළිබඳ හැඳින්වීම ..... 06

මානුෂීය මූලධර්ම ..... 08

මානුෂීය මූලධර්ම සහ මූලික මානුෂීය ප්‍රමිතිය ..... 09

මූලික මානුෂීය ප්‍රමිතිය යනු කුමක්ද? ..... 11

එකඟතා නවයේ අන්තර්ගතය (Essence of nine commitments) ..... 12

මානුෂීය ක්‍රියාමාර්ගයට පෙර පෞද්ගලික අංශයේ ක්‍රියාකාරකම් ..... 13

පළමුවන එකඟතාවය ..... 14

දෙවන එකඟතාවය ..... 17

තෙවන එකඟතාවය ..... 20

හතරවන එකඟතාවය ..... 23

පස්වන එකඟතාවය ..... 26

හයවන එකඟතාවය ..... 29

හත්වන එකඟතාවය ..... 32

අටවන එකඟතාවය ..... 35


නවවන එකඟතාවය ..... 38

තොරතුරු ලබා ගැනීම සඳහා සම්බන්ධ කර ගත හැකි පුද්ගලයින් සහ සහායක සංවිධාන ..... 41

මූලික මානුෂීය ප්‍රමිති පිරික්සුම් ලැයිස්තුව ..... 42

තොරතුරු මූලාශ්‍ර ..... 05

නීතිමය රාමුව ..... 47

# ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පණිවිඩය



මේජර් ජෙනරාල් එච්.එම්.යු. හේරත් (විශ්‍රාමික)
RWP RSP VSV USP MM Hdmc psc
අධ්‍යක්ෂ ජනරාල්

විපත්, අභියෝග සහ පසුබෑම් වලට මුහුණ දීමට සහ ඒවායින් ගොඩ ඒමට ඇති හැකියාව ශක්තිමත් කිරීම, අවදානම් අඩු කිරීම සහ ආපදා කළමනාකරණ උත්සාහයන් වැඩි දියුණු කිරීම සඳහා පෞද්ගලික අංශය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. සමාජයේ ව්‍යුහයට සහ ක්‍රියාකාරිත්වයට සහාය වන මූලික අංගයක් වන ව්‍යාපාරික අංශය, අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සපයනවා පමණක් නොව, මානුෂීය උත්සාහයන් සඳහා නවෝත්පාදනය, ප්‍රවීණතාව සහ ප්‍රමාණයෙන් හෝ පරිමාණයෙන් වෙනස් කිරීමේ ධාරිතාව ද ගෙන එයි.

මූලික මානුෂීය ප්‍රමිතීන් පිළිබඳ මාර්ගෝපදේශය පෞද්ගලික අංශය සඳහා වටිනා රාමුවක් ලෙස උපයෝගී වන අතර, ක්ෂණික ආපදා සහන සහ ප්‍රතිසාධන මෙහෙයුම් වලදී වගවීම, ගුණාත්මකභාවය සහ කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කරයි. මානුෂීය මූලධර්ම ව්‍යාපාරික භාවිතයන් සමඟ පෙළගැස්වීමෙන්, මානුෂීය මැදිහත්වීම්, ජනතාව කේන්ද්‍ර කරගත්, සාමාන්‍යයෙන් අපේක්ෂා කරන හෝ අවශ්‍ය සියලූම පාර්ශවයන් ඇතුළත් කර ගන්නා සහ දේශීය හැකියාවන්ට ගරු කරන බව සහතික කරයි.

නිශ්චිත කාල රාමුවක් හෝ කලාපයක් තුළ ස්වාභාවික විපත් හෝ ආන්තික කාලගුණික සිදුවීම් ඇතිවන වාර ගණන සහ බරපතලකම වැඩි වීමත් සමඟ, ව්‍යාපාර, රජයන්, සිවිල් සමාජය සහ මානුෂීය සංවිධාන අතර සහයෝගීතාවය කිසිදා නොවූ විරූ ලෙස තීරණාත්මක වේ. එක්ව, තිරසාර, ඔරොත්තු දෙන ප්‍රජාවන් පෝෂණය කරන අතරම, බලපෑමට ලක් වූවන්ගේ ගෞරවය සහ අයිතිවාසිකම් ආරක්ෂා කළ හැකිය.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස, ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම සහ පිරිසිදු ශ්‍රී ලංකාව ඇතුළු රජයේ මුලපිරීම් සමඟ සමපාත වන පරිදි මානුෂීය මූලධර්ම සහ මූලික මානුෂීය ප්‍රමිතිය ඔවුන්ගේ මෙහෙයුම් සඳහා ඒකාබද්ධ කරන ලෙස මම පෞද්ගලික අංශයේ ආයතනවලින් ඉල්ලා සිටිමි. එසේ කිරීමෙන්, ව්‍යාපාරවලට බාධාකාරී සිදුවීම් හෝ හදිසි අවස්ථා සඳහා ඵලදායී ලෙස සැලසුම් කිරීමට, කළමනාකරණය කිරීමට සහ ප්‍රතිචාර දැක්වීමට සංවිධානයකට හෝ පද්ධතියකට ඇති හැකියාවන් වැඩිදියුණු කර ගත හැකි අතර දිගුකාලීන ප්‍රජා සුවය සහ යහපැවැත්ම සඳහා අර්ථවත් ලෙස දායක විය හැකිය. සාමූහික ආපදා අවදානම් අවම කිරීමේ උත්සාහයන් මෙහෙයවීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් දැඩි ලෙස දිරිමත් කරයි. ආරක්ෂිත, වඩාත් ඔරොත්තු දෙන සහ සාධාරණ අනාගතයක් සඳහා අපි එක්ව කටයුතු කරමු.

# ලෝක ආහාර වැඩසටහනේ පණිවිඩය



අබ්දුර් රහීම් සිද්දික් මහතා
ලෝක ආහාර වැඩසටහනේ
ශ්‍රී ලංකා නියෝජිත සහ දේශීය අධ්‍යක්ෂ

දේශගුණික අර්බුදය වර්තමානයේ ඇති විශාලතම අභියෝගවලින් එකකි. විනාශකාරී ගංවතුරේ සිට දීර්ඝ කාලීන නියඟ දක්වා, දේශගුණික විපර්යාසයන් නිසා ඇතිවන ව්‍යසනයන් නිතර නිතර හා දරුණු වෙමින් පවතින අතර, ශ්‍රී ලංකාව පුරා ජීවිත, ජීවනෝපායන් සහ ආහාර සුරක්ෂිතතාවයට තර්ජනයක් වෙමින් පවතී. මෙම සිදුවීම් වේගයෙන් වර්ධනය වන විට, ආපදා ප්‍රතිචාර දැක්වීමේදී පෞද්ගලික අංශයේ කාර්යභාරය තවත් තීරණාත්මක වේ. ව්‍යාපාර යනු ආර්ථික වර්ධනය, සහ නිෂ්පාදනය ට සැලකිය යුතු ලෙස බලපාන ප්‍රධාන සාධකයින් පමණක් නොවේ. ව්‍යාපාරයන්,  සමාජ සම්බන්ධතා සහ සාමූහික ක්‍රියාකාරකම් උපයෝගී කර ගනිමින් විපත්ති සහ අභියෝගවලට ඵලදායී ලෙස ඔරොත්තු දීමට, අනුවර්තනය වීමට සහ යථා තත්ත්වයට පත් කිරීමට හැකි ප්‍රජාවන් ගොඩනැගීමේ සහ අර්බුද ඇති වූ විට කඩිනම්, ඵලදායී ප්‍රතිචාර සහතික කිරීමේ වැදගත් හවුල්කරුවන් වේ.

එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහනේ (World Food Programme) දී, ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව ආරක්ෂා කිරීම සඳහා වන පුළුල් ප්‍රයත්නයන්හි කොටසක් ලෙස ආපදා අවදානම් කළමනාකරණයේ ශ්‍රී ලංකාවේ හැකියාවන් ශක්තිමත් කිරීමට අපි කැපවී සිටිමු. ශ්‍රී ලංකාවේ ව්‍යසනයකින් පසු ප්‍රදේශයක සිදුවන භෞතික හා සමාජීය වෙනස්කම් වඩා හොඳින් අවබෝධ කර ගැනීම සඳහා, ලෝක ආහාර වැඩසටහන රජය, පෞද්ගලික අංශය සහ සිවිල් සමාජ සංවිධාන සමඟ එක්ව උපදේශන වැඩමුළුවක් පැවැත්වීය. මෙම වැඩමුළුව සැලකිය යුතු පරතරයක් හෙළි කළේය; දේශගුණික විපර්යාස සඳහා පෞද්ගලික අංශයේ ප්‍රතිචාර බොහෝ විට ස්ථාපිත මානුෂීය ප්‍රමිතීන්ට අනුකූල නොවූ අතර, එමඟින් ඔවුන්ගේ උත්සාහයන්ගේ කාර්යක්ෂමතාව සහ පසුබිම හෝ අනන්‍යතාවය නොසලකා සෑම කෙනෙකුටම අගය කරන සහ ගරු කරන බවක් දැනෙන පිළිගැනීමේ සහ සාධාරණ පරිසරයක් නිර්මාණය කිරීම (Inclusivity) සීමා විය හැකිය. මෙම පරතරය පියවීම සඳහා, ලංකා වාණිජ මණ්ඩලය සමඟ සාකච්ඡා කර, දේශගුණික හා ආපදා සඳහා සූදානම් ව්‍යාපෘතිය (Climate and Disaster Ready Project) මූලික මානුෂීය ප්‍රමිතිය සකස් කළේය. මෙම ප්‍රකාශනය හුදෙක් මාර්ගෝපදේශ මාලාවකට වඩා වැඩි යමක් ඇතුළත් කර ඇත. එය ශක්තිමත් හවුල්කාරිත්වයන් වර්ධනය කිරීම, ආපදා අවම කිරීම සහ ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීම සඳහා පුද්ගලයින්, ප්‍රජාවන් සහ සංවිධාන විසින් ගනු ලබන ක්‍රියාකාරී පියවර වැඩි දියුණු කිරීම, සහ අනාගතයේ ඇතිවිය හැකි අර්බුදවලට අනුවර්තනය වීමට සහ සමෘද්ධිමත් වීමට ඇති හැකියාව ශක්තිමත් කිරීම සඳහා වූ කැපවීමකි. එය ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ සංවිධාන සඳහා මාර්ග සිතියමක් ලෙස ක්‍රියා කරන අතර, ආපදා ප්‍රතිචාර මුලපිරීම්වලට මානුෂීය මූලධර්ම ඒකාබද්ධ කිරීමට ඔවුන්ට මග පෙන්වයි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හිමිකාරිත්වය යටතේ, ජාතික ප්‍රතිපත්තිවලට තිරසාර ලෙස ඒකාබද්ධ කිරීම මෙම මුලපිරීම තුළින් අපි අපේක්ෂා කරන්නෙමු. එක්ව, බෙදාගත් වගකීම සහ සහයෝගීතාවය තුළින්, ප්‍රජාවන් වඩා හොඳින් සූදානම් වන, සම්බන්ධීකරණ සහ මානුෂීය ප්‍රතිචාර සමඟ ආපදාවන්ට මුහුණ දෙන සහ කිසිවෙකුගේ පසුබිම හෝ තත්වයන් නොසලකා, සෑම කෙනෙකුටම ප්‍රගතියෙන් ප්‍රතිලාභ ලැබෙන බවත්, තිරසාර සංවර්ධන ඉලක්කවල දක්වා ඇති පරිදි, අවස්ථා සහ මූලික සේවාවන් සඳහා සමාන ප්‍රවේශයක් ඇති බවත් සහතික කළ හැකි අනාගතයක් අපට ගොඩනගා ගත හැකිය.

# ලංකා වාණිජ මණ්ඩලයේ පණිවිඩය



දුමින්ද හුලංගමුව මහතා
සභාපති
ලංකා වාණිජ මණ්ඩලය

ලංකා වාණිජ මණ්ඩලය වශයෙන්, ආපදා කළමනාකරණ ක්ෂේත්‍රයේ සේවයේ යෙදී සිටින රාජ්‍යය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශය සහ ආපදා කළමනාකරණ ක්ෂේත්‍රයේ නියැලී සිටින නිශ්චිත ප්‍රදේශයක වෙසෙන ප්‍රජාවන් සමඟ එක්ව වසර ගණනාවක් කටයුතු කිරීමේ අත්දැකීම් අප සතු වේ . ශ්‍රී ලංකාවේ සමස්ත ආපදා කළමනාකරණ රාමුව ශක්තිමත් කිරීම සඳහා මානුෂීය ආධාර සහ ආපදා අවදානම් අවම කිරීම සඳහා පෞද්ගලික අංශයේ මැදිහත්වීම ඉතා වැදගත් බව අපි තරයේ විශ්වාස කරමු.

භූමිකම්පා, ගංවතුර හෝ ලැව්ගිනි වැනි මිනිසුන්ට, දේපළවලට හෝ පරිසරයට හානි කළ හැකි අතිශය, ස්වභාවික උපද්‍රව මගින් ඇති කරන ආර්ථික අවදානම්, ක්‍රමයෙන් ඉහළ යමින් පවතින අතර, අපගේ ආර්ථික හා සමාජීය යහපැවැත්මට සහාය වන ස්වාභාවික සිදුවීම් සහ මිනිසා විසින් සාදන ලද පද්ධති අතර සම්බන්ධතා කාලයත් සමඟ වඩ වඩාත් පැහැදිලි වී ඇත. ගෝලීය අන්තර් රඳා පැවැත්ම ගැඹුරු වන විට, මෙම අභියෝග මගින් රජයන්, රාජ්‍ය නොවන සංවිධාන (ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන ඇතුළුව) සහ පෞද්ගලික අංශය ආපදා සඳහා සූදානම් වන, ප්‍රතිචාර දක්වන සහ යථා තත්ත්වයට පත් වන ආකාරය අඛණ්ඩව වැඩිදියුණු කිරීමේ හදිසි අවශ්‍යතාවය අවධාරණය කෙරේ.

මෙම සන්දර්භය තුළ, පෞද්ගලික අංශය සඳහා වූ මූලික මානුෂීය ප්‍රමිතීන් පිළිබඳ ශ්‍රී ලංකා මාර්ගෝපදේශය තීරණාත්මක මෙවලමක් ලෙස ක්‍රියා කරයි. ලෝක ආහාර වැඩසටහනේ මඟ පෙන්වීම යටතේ සහ ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමඟ සෘජු සහයෝගීතාවයෙන් සංවර්ධනය කරන ලද මෙම මාර්ගෝපදේශය, පෞද්ගලික අංශයේ මානුෂීය මුලපිරීම් ඵලදායී, ප්‍රතිචාරාත්මක සහ ආපදාවෙන් පීඩාවට පත් ප්‍රජාවන්ගේ අවශ්‍යතා සමඟ පෙළගැසී ඇති බව සහතික කිරීම අරමුණු කරයි. මෙම මාර්ගෝපදේශයේ දක්වා ඇති මූලධර්ම අනුගමනය කිරීමෙන්, පෞද්ගලික අංශයේ සංවිධානවලට ඔවුන්ගේ මානුෂීය සහ ප්‍රජා සංවර්ධන උත්සාහයන් - විශේෂයෙන් ඔවුන්ගේ ආයතනික සමාජ වගකීම් වැඩසටහන් යටතේ ඇති - ජාත්‍යන්තර මානුෂීය ප්‍රමිතීන්ට අනුකූල යැයි සහතික කළ හැකි බව අපට විශ්වාසයි. මෙම මාර්ගෝපදේශය සංවර්ධනය කිරීමට දායක වූ ලෝක ආහාර වැඩසටහන, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ උපදේශකයින්ගේ සහ කාර්ය මණ්ඩලයේ කැපවීම සහ උත්සාහය අපි අගය කරමු. ඔවුන්ගේ සහයෝගය සහ කැපවීම මෙම මාර්ගෝපදේශය නිර්මාණය කිරීමට ගත් උත්සාහය සාර්ථක කර ගැනීමට හේතු විය. ඔවුන්ගේ සාමූහික උත්සාහයන් නොමැතිව මෙම අගනා සම්පත සාක්ෂාත් කරගත නොහැකි වනු ඇත. මෙම මාර්ගෝපදේශයේ අඩංගු තොරතුරු පෞද්ගලික අංශයට නිවැරදි සහ ගැඹුරු අවබෝධයක් ලබාදීම සහ ප්‍රයෝජනවත් බව ඔප්පු කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු. එමඟින් ගුණාත්මක, විනිවිද පෙනෙන සහ වගකිවයුතු මානුෂීය ආධාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට හැකි වේ. පෞද්ගලික අංශයේ අපගේ සියලුම හවුල්කරුවන්ට සහ කොටස්කරුවන්ට මෙම මාර්ගෝපදේශය ඉතා සතුටින් අපි නිර්දේශ කරන්නෙමු. හදිසි අවස්ථා වලදී මානුෂීය මුලපිරීම් සඳහා සහාය වීමට මෙන්ම සාමූහික ක්‍රියාකාරිත්වය සහ සම්පත්දායකත්වය තුළින් ස්වාභාවික හා මිනිසා විසින් සාදන ලද ව්‍යසන හෝ හදිසි අවස්ථා සඳහා සූදානම් වීමට, ඔරොත්තු දීමට සහ යථා තත්ත්වයට පත් කිරීමට ප්‍රජාවකට ඇති හැකියාව සහ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීමට ඔවුන් එය භාවිතා කිරීමට දිරිමත් කරමු.

# හැඳින්වීම

මූලික මානුෂීය ප්‍රමිතිය (Core Humanitarian Standard - CHS), ව්‍යසනයකින් ඍජුව හෝ වක්‍රව බලපෑමට ලක් වූ පුද්ගලයින්, කණ්ඩායම් සහ ප්‍රජාවන් ගේ අයිතිවාසිකම් සහ ගෞරවයට ගරු කරමින් මානුෂීය ක්‍රියාමාර්ග සිදු කරන බව සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය රාමුවක් සපයයි. කැපවීම් හෝ එකඟතාවයන් නවයකින් සමන්විත (Core Humanitarian Standard - CHS) ප්‍රජාවන් සහ ඔවුන්හට සහාය දක්වන අය අතර සමානාත්මතාවය, සහයෝගීතාවය සහ වගවීම ප්‍රවර්ධනය කිරීම සඳහා නිර්මාණය කර ඇති ගෝලීය වශයෙන් පිළිගත් සහ මැනිය හැකි ප්‍රමිතියක් ලෙස සේවය කරයි. බල අසමතුලිතා ආමන්ත්‍රණය කිරීමෙන් සහ අර්බුද විසඳීමේදී ප්‍රජාවන්ගේ මූලික කාර්යභාරය අවධාරණය කිරීමෙන්, මූලික මානුෂීය ප්‍රමිතිය මානුෂීය උත්සාහයන් ඵලදායී වන අතර පහසුවෙන් අවදානමට ලක්විය හැකි අයගේ අවශ්‍යතා සමග පෙළගැසී ඇති බව සහතික කරයි.

මනුෂ්‍යත්වය, අපක්ෂපාතීත්වය, ස්වාධීනත්වය සහ මධ්‍යස්ථභාවය යන මූලධර්ම මත පදනම් වූ, මූලික මානුෂීය ප්‍රමිතිය, සූදානම, ප්‍රතිචාර දැක්වීම, යථා තත්ත්වයට පත් කිරීම සහ අවම කිරීම ඇතුළුව ආපදාවක සෑම අදියරකදීම ගෞරවාන්විතව ජීවත්වීමේ අයිතිය, ආධාර ලබා ගැනීමේ අයිතිය සහ ආරක්ෂාව සහ ආරක්ෂාව සඳහා ඇති අයිතිය ඇතුළත් Sphere Humanitarian Charter මත ගොඩනගා ඇත. මෙම ප්‍රමිතිය ආපදා අවදානම් අවම කිරීමේ සහ අර්බුදකාරී අවස්ථාවන්හිදී මානුෂීය ප්‍රතිචාර දැක්වීමේ නිරත වන පෞද්ගලික අංශයේ ආයතනවලට පමණක් අදාළ නොවන අතර මෙකී ප්‍රමිතීන් සාම්ප්‍රදායිකව මානුෂීය කටයුතුවල නියැලී සිටින සංවිධානවලට ද බෙහෙවින් අදාළ වේ. පෞද්ගලික අංශය සඳහා, ඔවුන්ගේ මැදිහත්වීම්වල බලපෑම වැඩි දියුණු කිරීම සඳහා මූලික මානුෂීය ප්‍රමිති මූලධර්ම ඔවුන්ගේ මෙහෙයුම්වලට ඒකාබද්ධ කිරීම ඉතා වැදගත් වේ. මෙම ප්‍රමිතීන්ට අනුකූල වීම ව්‍යාපාරවලට ඔවුන්ගේ මානුෂීය ව්‍යාපෘතිවල කාර්යක්ෂමතාව තක්සේරු කිරීමට සහ වැඩිදියුණු කිරීමට ඉඩ සලසයි, එමඟින් ගුණාත්මකභාවය සහ වගවීම සඳහා ගෝලීය මිණුම් සලකුණු සපුරාලීම සහතික කෙරේ. තවද, ජාත්‍යන්තරව පිළිගත් මානුෂීය ප්‍රමිතීන් සමඟ පොදු ඉලක්කයක් හෝ අරමුණක් කරා වැඩ කිරීම සඳහා තනි පුද්ගල හෝ කණ්ඩායම් ක්‍රියාමාර්ග සම්බන්ධීකරණය කිරීම සහ ඒකාබද්ධ කිරීමෙන්, මූලික මානුෂීය ප්‍රමිති රාමුව පුද්ගලික අංශයට තම ආයතනික සමාජ වගකීම හෝ ආපදා ආධාර සඳහා ඔවුන්ගේ වාණිජමය මැදිහත්වීම ඉටු කිරීමට උපකාරී වේ. මෙම ප්‍රවේශය බලපෑමට ලක් වූ ප්‍රජාවන් අතර විනිවිදභාවය සහ විශ්වාසය වැඩි කරනවා පමණක් නොව, හදිසි අවස්ථා වලදී අත්‍යවශ්‍ය භාණ්ඩ, සේවා සහ පැවැත්ම, යහපැවැත්ම සහ ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය සහාය ලබා ගැනීමට ඇති අඛණ්ඩ ප්‍රවේශය සුරක්ෂිත කරයි. මේ ආකාරයට, පෞද්ගලික අංශය මූලික මානුෂීය ප්‍රමිතියට අනුගත වීම, ආපදා සූදානම, ප්‍රතිචාර දැක්වීම සහ ප්‍රජා පුනරුත්ථාපනය සඳහා අත්‍යවශ්‍ය හවුල්කරුවෙකු ලෙස එහි භූමිකාව ශක්තිමත් කරයි.

# පෞද්ගලික අංශයේ මානුෂීය උත්සාහයන්

මානුෂීය කටයුතු සඳහා පෞද්ගලික අංශයේ වැඩිවන මැදිහත්වීම සමස්ත කාර්යක්ෂමතාව සැලකිය යුතු ලෙස වැඩිදියුණු කළ හැකිය. විවිධ කුසලතා, නිපුණතා, නිශ්චිත පිළිවෙළකට නව සහ වටිනා දෙයක් හඳුන්වා දෙන ක්‍රම, භාවිතා කිරීමෙන් සහ නැවුම් දෘෂ්ටිකෝණයන්ගෙන් දායක වීමෙන්, පෞද්ගලික සමාගම්වලට සාම්ප්‍රදායික මානුෂීය සංවිධානවල කාර්යයන් සඳහා ඵලදායී ලෙස සහාය දැක්විය හැකිය. ඔවුන්ගේ දායකත්වයන් සාමාන්‍යයෙන් පරිත්‍යාග හෝ වාණිජ කටයුතු යන ප්‍රධාන ආකාර දෙකකින් සිදුවේ. හදිසි අවස්ථා වලදී පුද්ගලික අංශයේ ආයතන සඳහා වාණිජ අවස්ථා මතු විය හැකි අතර, එහිදී සහන ආයතන සහන සේවා සඳහා අවශ්‍යය භාණ්ඩ ප්‍රභවයේ සිට පරිභෝජනය දක්වා කාර්යක්ෂමව ප්‍රවාහනය සහ ගබඩා කිරීම සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය (logistics), භාණ්ඩ හා සේවා ඒවායේ මූලාරම්භයේ සිට පරිභෝජනය දක්වා කාර්යක්ෂමව ගලා යාම සහතික කරමින්, කළමනාකරණයට සම්බන්ධ සියලුම ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සහ කළමනාකරණය කිරීම (supply chain management) හෝ තාක්ෂණික සහාය වැනි අත්‍යවශ්‍ය සේවාවන් සැපයීම සඳහා පෞද්ගලික අංශය සමඟ ගිවිසුම්ගත වේ. පෞද්ගලික අංශයේ කාර්යක්ෂමතාව, විශේෂඥතාව සහ සම්පත් උපයෝගී කර ගැනීමෙන්, අවශ්‍යතා ඇති අය වෙත ළඟා වීමේදී මානුෂීය උත්සාහයන් වඩාත් විධිමත් හා ඵලදායී විය හැකිය.

කෙසේ වෙතත්, පෞද්ගලික අංශයේ මැදිහත්වීමෙන් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා, සමාගම් අර්බුද ප්‍රතිචාර දැක්වීමේ සංකීර්ණතා පිළිබඳ ගැඹුරු අවබෝධයක් ඇති ස්ථාපිත මානුෂීය ආයතනවල ක්‍රියාකාරීන් සමඟ සමීප හවුල්කාරිත්වයකින් කටයුතු කළ යුතුය. ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ එක්සත් ජාතීන්ගේ ආයතන ඇතුළු මෙම ක්‍රියාකාරීන්ට, සම්බන්ධීකරණය, ආචාර ධර්ම, සහ පහසුවෙන් අවදානමට ලක්විය හැකි කණ්ඩායම් හෝ ප්‍රජාවන්ගේ අවශ්‍යතා සපුරාලීම ඇතුළු මානුෂීය අර්බුදවල ජය ගැනීමට නිශ්චිත ප්‍රවේශයන් හෝ විසඳුම් අවශ්‍ය වන දුෂ්කරතා හෝ අභියෝගවලට මුහුණ දීමට අවශ්‍ය අත්දැකීම් සහ දැනුම ඇත.

එපමණක් නොව, පෞද්ගලික අංශයේ සමාගම් ජාතික සහ පළාත් පාලන ආයතන සමඟ සමීපව සම්බන්ධීකරණය විය යුතුය. ශ්‍රී ලංකාව වැනි රටවල රජයන් නිතර මානුෂීය මූලපිරීම් මෙහෙයවන විට, මහා පරිමාණ ප්‍රතිචාර මෙහෙයවීමට සහ කළමනාකරණය කිරීමට අවශ්‍ය නීතිමය අධිකාරිය සහ යටිතල පහසුකම් රාජ්‍ය බලධාරීන් සතුව ඇත. පෞද්ගලික අංශයේ උත්සාහයන් රජයේ සැලසුම් සමඟ පෙළගැස්වීමෙන් ලැබෙන දායකත්වය, ජාතික ප්‍රමුඛතා සහ ප්‍රමිතීන්ට අනුකූල වන බව සහතික කෙරේ. රජය බොහෝ විට මානුෂීය ක්‍රියාමාර්ග සඳහා පෙරමුණ ගන්නා ශ්‍රී ලාංකික ජනතාවගේ, සංස්කෘතිය, ඉතිහාසය සහ සමාජ ගතිකත්වයේ නිශ්චිත තත්වයන්, පසුබිම සහ ලක්ෂණ, මෙම රජයේ මූලිකත්වයෙන් යුත් මූලපිරීම් සඳහා සහාය වීම සඳහා පෞද්ගලික සමාගම්වල සහභාගීත්වය ව්‍යුහගත කළ යුතුය.

# වචනාවලිය

මූලික මානුෂීය ප්‍රමිතිය සඳහා, පහත අර්ථ දැක්වීම් අදාළ වේ.

වගවීම (Accountability): බලය වගකීමෙන් යුතුව භාවිතා කිරීමේ ක්‍රියාවලිය සහ විවිධ කොටස්කරුවන්, ප්‍රධාන වශයෙන් එවැනි බලය ක්‍රියාත්මක කිරීමෙන් බලපෑමට ලක් වූ අය, සැලකිල්ලට ගෙන වගකිව යුතු බවට පත් කිරීමේ ක්‍රියාවලිය. වගවීම යනු මූලික මානුෂීය ප්‍රමිතියේ කැපවීම් හෝ එකඟතාවයන් නවයේ විස්තර කර ඇති පරිදි, මිනිසුන්ට සහ ප්‍රජාවන්ට බලපාන ගැටළු සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී ඔවුන් කේන්ද්‍රස්ථානයට පත් කිරීමයි.

සුසංයෝගී / ගැළපෙන සංවිධානාත්මක ප්‍රවේශය (Coherent organizational Approach): ඉලක්ක සපුරා ගැනීම සඳහා සංවිධානයක් තුළ අනුගමනය කරන ලද ව්‍යුහගත සහ ක්‍රමානුකූල ක්‍රමවේද, හොඳම භාවිතයන් මත පදනම්ව සංවිධානය පුරා අඛණ්ඩව පිළිපැදීම සහ එහි අවශ්‍යතාවලට අනුව සකස් කිරීම.

විවිධත්වය (Diversity): අනන්‍යතා, පසුබිම්, අත්දැකීම්, දෘෂ්ටිකෝණ සහ ලක්ෂණ අනුව මිනිසුන් අතර වෙනස්කම් පැවතීම.මෙම වෙනස්කම්වලට ජාතිය, ජනවාර්ගිකත්වය, ස්ත්‍රී පුරුෂ භාවය, වයස, ස්ත්‍රී පුරුෂ භාවය සම්බන්ධයෙන් පුද්ගලයෙකුගේ අනන්‍යතාවය (sexual orientation), සමාජ ආර්ථික තත්ත්වය, හැකියාවන් / ආබාධ, ආගමික විශ්වාසයන් සහ සංස්කෘතික පසුබිම් වැනි සාධක ඇතුළත් විය හැකි නමුත් ඒවාට පමණක් සීමා නොවේ.

සහතික කිරීම (Ensure): කැපවීම් හෝ එකඟතාවයන් සිදුවන බව සහතික කිරීම සඳහා සංවිධානය විසින් යම් ප්‍රමාණයක අභ්‍යන්තර නිරීක්ෂණයක්, අධීක්ෂණයක් සහ පාලනයක් ඇති බව අදහස් කිරීම.

සාධාරණත්වය (Equity): පුද්ගලයන්ට හෝ කණ්ඩායම්වලට ඔවුන්ගේ නිශ්චිත අවශ්‍යතා අනුව සාධාරණ ලෙස සලකනු ලබන තත්වයක්.

ඇතුළත් කිරීම (Inclusion): විවිධ පසුබිම්වලින් පැමිණි සහ විවිධ අනන්‍යතා ඇති පුද්ගලයින්ගේ පූර්ණ සහභාගීත්වයට ගරු කරන, අගය කරන සහ සහාය දෙන පරිසරයන් නිර්මාණය කිරීමට සහ පුහුණු කිරීමට හිතාමතා සහ ක්‍රියාශීලී ව ගන්නා උත්සාහයක්.

මානුෂීය ආධාර (Humanitarian assistance): ජීවිත බේරා ගැනීම, දුක් වේදනා සමනය කිරීම, ගෞරවය යථා තත්ත්වයට පත් කිරීම සහ සමස්ත බලපෑම අවම කිරීම අරමුණු කරගනිමින්, ආපදා හෝ අර්බුදවලින් තර්ජනයට ලක් වූ හෝ පීඩාවට පත් වූ පුද්ගලයින්ට හෝ ප්‍රජාවන්ට ලබා දෙන මානුෂීය ආධාර සහ සහයෝගය අදහස් කෙරේ. එය සූදානම, ප්‍රතිචාර දැක්වීම, යථා තත්ත්වයට පත් කිරීම සහ අවම කිරීම ඇතුළුව ආපදාවක සියලු අදියරයන් ආවරණය කරයි. මානුෂීය ආධාර මධ්‍යස්ථභාවය, අපක්ෂපාතීත්වය සහ ස්වාධීනත්වය යන මූලධර්ම මගින් මෙහෙයවනු ලබන අතර, වෙනස්කම් කිරීමකින් තොරව ආධාර වඩාත් අවශ්‍යතා ඇති අයට ළඟා වන බව සහතික කරයි.

**මානුෂීය අවශ්‍යතා** (Humaniatarian Needs): ව්‍යසනයකින් පීඩාවට පත් පුද්ගලයින්ගේ හෝ ප්‍රජාවන්ගේ පැවැත්ම, යහපැවැත්ම සහ ගෞරවය සඳහා අවශ්‍ය මූලික සහ අත්‍යවශ්‍ය අවශ්‍යතා. බලපෑමට ලක් වූ ප්‍රජාවන් ක්ෂණික සහන, යථා තත්ත්වයට පත් කිරීම සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා මෙම අවශ්‍යතා අත්‍යවශ්‍ය වේ. ඒවාට ආහාර, පිරිසිදු ජලය, නවාතැන්, සෞඛ්‍ය සේවා, සනීපාරක්ෂාව, ආරක්ෂාව සහ අනෙකුත් තීරණාත්මක සේවාවන් සඳහා ප්‍රවේශය ඇතුළුව භෞතික, චිත්තවේගීය (emotional) සහ සමාජීය අංශ ඇතුළත් වේ. මෙම අවශ්‍යතා සපුරාලීම දුක් වේදනා අඩු කිරීමට සහ ආපදාවකින් පසු ඔරොත්තු දීමේ හැකියාවට සහාය වීමට මූලික වේ.

**වඩාත්ම ආන්තිකකරණයට ලක් වූවන්** (Most Marginalized): තම අනන්‍යතා, පසුබිම්, අත්දැකීම්, දෘෂ්ටිකෝණ සහ ලක්ෂණ හේතුවෙන් වෙනස්කම් කිරීම්වලට ලක්වීමේ හෝ අත්විඳීමේ අවදානමක් ඇති ඕනෑම පුද්ගලයෙකු.

**සංවිධානය** (Organisation): මූලික මානුෂීය ප්‍රමිතිය ක්‍රියාත්මක කිරීමට සම්පත් සහ කැපවීමක් ඇති ආයතනයක් හෝ පුද්ගලයෙක්. මෙයට ඕනෑම ප්‍රජා පාදක ව්‍යුහයක්, සිවිල් සමාජයක් සංවිධානයක්, කාරුණික අනුග්‍රහය ලබාදෙන හෝ ලාභ නොලබන සංවිධානයක්, පෞද්ගලික අංශයේ සමාගමක් හෝ පොදු අධිකාරියක්, ජාත්‍යන්තර සංවිධාන, සමූහ ව්‍යාපාරයක් හෝ දේශීය, ජාතික හෝ ජාත්‍යන්තර මට්ටමින් ක්‍රියාත්මක වන වෙනත් ආයතන ඇතුළත් වේ, නමුත් ඒවාට පමණක් සීමා නොවේ.

**සහභාගීත්වය** (Participation): මිනිසුන්ට සහ ප්‍රජාවන්ට බලපාන සියලු තීරණ ගැනීමේ ක්‍රියාවලීන්හි ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කිරීමට ඉඩ සලසන ක්‍රියාවලීන් සහ ක්‍රියාකාරකම්. අර්ථවත් සහභාගීත්වයට වඩාත්ම අවදානමට ලක්විය හැකි සහ ආන්තිකකරණයට ලක් වූවන් ඇතුළුව සියලුම කණ්ඩායම් ඇතුළත් වන අතර එය ජනතාවගේ නිශ්චිත අවශ්‍යතා සහ මනාපයන්ට අනුකූලව සංවිධානය වී ඇත. සහභාගීත්වය ස්වේච්ඡාවෙන් සිදු වේ.

**අර්බුද සහ පහසුවෙන් අවදානමට ලක්විය හැකි තත්ත්වයන් යටතේ සිටින පුද්ගලයින් සහ ප්‍රජාවන්** (People and communities in situations of crisis and vulnerability): ආපදා, ගැටුම්, දරිද්‍රතාවය හෝ වෙනත් අර්බුද සහ අභියෝගවලින් පීඩාවට පත් වූ හෝ විවිධ අවශ්‍යතා, අවදානම් සහ හැකියාවන් ඇති කාන්තාවන්, පිරිමින්, ගැහැණු ළමයින් සහ පිරිමි ළමයින් යන සියලු දෙනා.

**පෞද්ගලික අංශය** (Private Sector): මානුෂීය කටයුතු සම්බන්ධයෙන් ගත් කල, පෞද්ගලික අංශය යනු රජයේ අයිතියෙන් හෝ පාලනයෙන් ස්වාධීන වන ලාභ අරමුණු කරගත් ව්‍යාපාර සහ ව්‍යවසායන් ය. එයට මානුෂීය කටයුතු සඳහා සහාය වීම සඳහා භාණ්ඩ, සේවා, සම්පත් හෝ අරමුදල් සපයන සමාගම්, සංස්ථා සහ ව්‍යාපාරික ආයතන ඇතුළත් වේ.

**ක්‍රියාවලිය** (Process): නිශ්චිත කාර්යයක් හෝ ඉලක්කයක් ස්ථාවර හා කාර්යක්ෂම ආකාරයකින් ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග, මෙවලම් සහ සම්පත්. මේවා සන්දර්භය සහ සංවිධානයක ප්‍රමාණය හා ධාරිතාව වැනි සාධක මත පදනම්ව අඩු හෝ වැඩි වශයෙන් විධිමත් විය හැකිය.

**ගුණාත්මකභාවය** (Quality): ජනතාවට සහ ප්‍රජාවන්ට ලබා දෙන සහයෝගය ඔවුන්ගේ සෘජුවම ප්‍රකාශ නොකරන අවශ්‍යතා හෝ ප්‍රකාශිත අවශ්‍යතා සහ අපේක්ෂාවන් සපුරාලන බවත් ජනතාවගේ ගෞරවයට ගරු කරන බවත් සහතික කරන ලක්ෂණ සමූහයකි.

**ඔරොත්තු දීමේ හැකියාව** (Resilience): උපද්‍රවයකට නිරාවරණය වන පුද්ගලයෙකුට හෝ ප්‍රජාවකට කාලෝචිත හා කාර්යක්ෂම ආකාරයකින් උපද්‍රවයක බලපෑම් වලට ප්‍රතිරෝධය දැක්වීමට, අවශෝෂණය කර ගැනීමට, අනුගත වීමට සහ ඉන් ගොඩ ඒමට ඇති හැකියාව.

**සම්පත්** (Resources): ස්වභාවික, මානව, මූල්‍ය, ප්‍රාග්ධනය, තාක්ෂණික සහ තොරතුරු ඇතුළුව නමුත් ඒවාට පමණක් සීමා නොවී, සංවිධානයකට තම මෙහෙවර ඉටු කිරීමට අවශ්‍ය දේ.

**අයිතිවාසිකම්** (Rights): මානුෂීය ප්‍රඥප්තියේ විස්තර කර ඇති පරිදි, ගෞරවයෙන් යුතුව ජීවත්වීමට ජනතාවට ඇති අයිතිය, සහයෝගය සහ සහාය ලබා ගැනීමට ඇති අයිතිය සහ ආරක්ෂාව සඳහා ඇති අයිතිය.

**කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයින්** (Staff and volunteers): පාලනය සහ නායකත්වය දරන්නන්, ස්ථිර හෝ කෙටි කාලීන සේවකයින්, සහ උපදේශකයින් ඇතුළුව සංවිධානයක නිශ්චිත වගකීම් හෝ බලතල සහිත ඕනෑම නියෝජිතයෙකු.

**සහයෝගය** (Support): ඉලක්ක සපුරා ගැනීමට, අවශ්‍යතා සපුරාලීමට හෝ අභියෝග ජය ගැනීමට සංවිධානයක් විසින් පුද්ගලයින් සහ ප්‍රජාවන් සමග සපයන හෝ බෙදා ගන්නා ඕනෑම කාර්යයක් හෝ ක්‍රියාකාරකමක්.

# මාර්ගෝපදේශය පිළිබඳ හැඳින්වීම

ශ්‍රී ලංකාවේ මානුෂීය ආධාර ප්‍රයත්නයන්හි පුද්ගලික අංශය ක්‍රියාකාරී හවුල්කරුවෙකු වී ඇත. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ආපදා සහන සඳහා මූලික වගකීම දරන ප්‍රධාන රාජ්‍ය ආයතනය ලෙස කටයුතු කරන අතර, තවත් බොහෝ රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශයේ ආයතන ද ආපදා හෝ ඒ හා සමාන හදිසි අවස්ථා අපේක්ෂාවෙන් සහ ප්‍රතිචාර වශයෙන් ආපදාවෙන් පීඩාවට පත් ප්‍රජාවන්ට පුළුල් පරාසයක මානුෂීය සහාය ලබා දීමට සම්බන්ධ වේ. මානුෂීය ප්‍රයත්නයන් සඳහා පෞද්ගලික අංශයේ මැදිහත්වීම සඳහා ඇතැම් නියාමන විධිවිධාන පැවතුනද, ජාත්‍යන්තරව පිළිගත් මානුෂීය ප්‍රතිචාර ප්‍රමිතීන්ට අනුකූලව මෙම ප්‍රයත්නවල ගුණාත්මකභාවය සහ වගවීම වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවයක් පවතී.

මානුෂීය සැකසුම් තුළ පෞද්ගලික අංශයේ කාර්යභාරය පහත දක්වා ඇති පරිදි විවිධ ආකාරයෙන් සිදුවිය හැකිය :

- **ඍජු දායකත්වයන්:** අර්බුදකාරී කාලවලදී මානුෂීය සංවිධානවලට මුදල්, භාණ්ඩ හෝ සේවා පරිත්‍යාග කිරීම.
- **හවුල්කාරිත්වයන්:** සැපයුම් බෙදාහැරීමට සහාය වන සැපයුම් සමාගම් හෝ සන්නිවේදන මෙවලම් සපයන තාක්ෂණ සමාගම් වැනි ආධාර ලබා දීම සඳහා මානුෂීය සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- **ආයතනික සමාජ වගකීම:** පුද්ගලික සමාගම්වලට ආපදා සහන සහ දිගුකාලීන මානුෂීය සංවර්ධනය ඇතුළු සමාජීය අරමුණු සඳහා සහාය වීම සඳහා කැප වූ වැඩසටහන් තිබිය හැකිය.
- **නව්‍යකරණය (innovation) සහ විසඳුම්:** සමාගම් විසින් මානුෂීය සැකසුම්වල අභියෝගවලට ඍජුවම මුහුණ දෙන නව්‍ය නිෂ්පාදන හෝ සේවා (උදා: ජල පිරිපහදු පද්ධති, නවාතැන් විසඳුම්) සංවර්ධනය කළ හැකිය.
- **කුසලතා සහ ප්‍රවීණතාව / නිපුණතාව :** මානුෂීය මෙහෙයුම්වල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා භාණ්ඩ හා සේවා මූලාරම්භයේ සිට පරිභෝජනය දක්වා කාර්යක්ෂමව ගලා යාම සහතික කරමින්, කළමනාකරණයට සම්බන්ධ සියලුම ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සහ කළමනාකරණය කිරීම (supply chain management) මූල්‍ය හෝ සන්නිවේදනය වැනි ක්ෂේත්‍රවල විශේෂිත නිපුණතාවන් ව්‍යාපාරවලට ලබා දිය හැකිය.

මෙම සන්දර්භය තුළ, පෞද්ගලික අංශය මානුෂීය උත්සාහයන් සඳහා කාර්යක්ෂමතාව, නවෝත්පාදනය සහ අතිරේක සම්පත් ගෙන ඒමට හැකි ප්‍රධාන හවුල්කරුවෙකු ලෙස පිළිගැනේ, එය රාජ්‍යය අංශය  සහ රාජ්‍ය නොවන සංවිධානවල කාර්යයන්ට අනුපූරක වේ. මෙම පසුබිමට තුළ, ලෝක ආහාර වැඩසටහන සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමඟ සහයෝගීතාවයෙන් ලංකා වාණිජ මණ්ඩලය විසින් පුද්ගලික අංශයේ මූලික මානුෂීය ප්‍රමිති මාර්ගෝපදේශය සකස් කරන ලදී. මෙම මාර්ගෝපදේශය ඉතා කෙටියෙන්  බොහෝ දේ ප්‍රකාශ කරන අතර, භාවිතා කිරීමට හෝ තේරුම් ගැනීමට පහසුලෙස නිර්මාණය කර ඇති අතර, ශ්‍රී ලංකාවේ මානුෂීය ආධාර ව්‍යාපෘති වලදී පෞද්ගලික අංශයට මඟ පෙන්වීම සඳහා වන එක් එක් එකඟතාවය යටතේ අදාළ අවශ්‍යතා සහ මාර්ගෝපදේශ සහිත මූලික මානුෂීය සම්මත එකඟතාවයන් නවය ඇතුළත් කර ඇත.

මූලික මානුෂීය ප්‍රමිතීන් පිළිබඳ මාර්ගෝපදේශය, මානුෂීය මූලධර්ම ප්‍රකාශ කිරීම සහ මානුෂීය කටයුතුවලදී ඔවුන්ගේ නියාමන රාමු හැඩගැස්වීම සඳහා පෞද්ගලික අංශයට අත්‍යවශ්‍ය මග පෙන්වීමක් ලබා දීම අරමුණු කරගනියි. මූලික මානුෂීය ප්‍රමිතියට අනුකූල වීම තුළින්, ආපදාවන්ට ලක් වූ ප්‍රජාවන්ට ලබා දෙන මානුෂීය ආධාරවල කාර්යක්ෂමතාව සැලකිය යුතු ලෙස වැඩි දියුණු කරනු ඇත. ආපදා තත්ත්වයන්හි විවිධ අවධීන් හරහා සංකීර්ණ ආපදා ආධාර ලබාදීමේ ප්‍රයත්නයන් සඳහා පෞද්ගලික අංශය සම්බන්ධ වීමේදී හා තීරණ ගැනීමේදී මෙම මාර්ගෝපදේශය වටිනා සම්පතක් ලෙස මග පෙන්වීමක් ලබා දෙනු ඇත. මූලික මානුෂීය ප්‍රඥප්තිය පිළිබඳ මාර්ගෝපදේශ අනුගමනය කිරීමෙන්, පෞද්ගලික අංශය  සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරනු ලබන කරුණු පහත දැක්වේ.

1. ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී සාධාරණත්වය සහ විනිවිදභාවය පවත්වා ගැනීම.
2. කොන්ත්‍රාත් ටෙන්ඩර් ක්‍රියා පටිපාටිවල විනිවිදභාවය පිළිපැදීම.
3. බලපෑමට ලක් වූ ප්‍රජාවන් තුළ වැඩි විශ්වාසයක් සහ පිළිගැනීමක් ඇති වීම
4. වැඩිදියුණු කළ ආයතනික විශ්වසනීයත්වය සහ නීත්‍යානුකූලභාවය
5. ප්‍රතිලාභ සහ අනර්ථකාරී නොවන මූලධර්මවලට කැපවීම
6. හදිසි අවස්ථා සහ අර්බුද වලදී අඛණ්ඩ ප්‍රවේශය සහතික කිරීම

# මානුෂීය මූලධර්ම

සියලු මානුෂීය ක්‍රියාවන්හි හරය වන්නේ මනුෂ්‍යත්වය, අපක්ෂපාතීත්වය, මධ්‍යස්ථභාවය සහ ස්වාධීනත්වය යන මූලික මූලධර්මයි. ජාත්‍යන්තර මානුෂීය නීතියේ මුල් බැසගත් මෙම මූලධර්ම, මානුෂීය ප්‍රතිචාරයක් යනු කුමක්ද යන්න නිර්වචනය කිරීමට සහාය වේ. 46/182 සහ 58/114 යන මහා සභා යෝජනා හරහා එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් මෙම මූලධර්ම විධිමත් ලෙස පිළිගෙන ඇත.

**මනුෂ්‍යත්වය** : චිත්තවේගීය සහ අධ්‍යාත්මික පීඩාවන්වලින් මිනිස්සු දුක්විඳීම කොතැනක දක්නට ලැබුණත් ඒවාට විසඳුම් සෙවිය යුතුය. ජීවිතය හා සෞඛ්‍යය ආරක්ෂා කිරීම සහ මිනිසුන් කෙරෙහි ගෞරවය සහතික කිරීම මානුෂීය ක්‍රියාමාර්ගවල අරමුණු වේ.

**අපක්ෂපාතීත්වය** : මානුෂීය ක්‍රියාමාර්ග අවශ්‍යතාවය මත පමණක් සිදු කළ යුතු අතර, හදිසි ආපදා අවස්ථාවන්ට ප්‍රමුඛතාවය ලබා දී ජාතිකත්වය, ජාතිය, ස්ත්‍රී පුරුෂ භාවය, ආගමික විශ්වාසයන්, පංතිය හෝ දේශපාලන මතය මත කිසිදු අහිතකර වෙනසක් නොකළ යුතුය.

**මධ්‍යස්ථභාවය** : මානුෂීය ක්‍රියාකාරීන් එදිරිවාදිකම්වලදී පැත්තක් නොගත යුතු අතර දේශපාලනික, වාර්ගික, ආගමික හෝ දෘෂ්ටිවාදාත්මක ස්වභාවයේ මතභේදවලට සම්බන්ධ නොවිය යුතුය.

**ස්වාධීනත්වය** : මානුෂීය මෙහෙයුම්වල නියැලී සිටින ඕනෑම පාර්ශ්වයක් අපක්ෂපාතී සහ ස්වාධීන විය යුතු අතර, ඔවුන්ගේ මෙහෙයුම් සිදු කරන ස්ථානවල මානුෂීය මෙහෙයුම්වලට ආවේණික විය හැකි ඕනෑම දේශපාලන, ආර්ථික, හමුදාමය හෝ වෙනත් සලකා බැලීම්වලින් නිදහස් විය යුතුය.

මෙම මූලධර්ම, Red Cross and Red Crescent Movement සහ ආපදා සහන කටයුතු සඳහාවූ රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන හැසිරීම් සංග්‍රහය (code of conduct), මානුෂීය ප්‍රඥප්තිය (Humanitarian Charter) සහ මානුෂීය ප්‍රතිචාරයේ අවම ප්‍රමිතීන් (Minimum Standards in Humanitarian Response) සහ ගුණාත්මකභාවය සහ වගවීම පිළිබඳ මූලික මානුෂීය ප්‍රමිතිය (CHS on quality and accountability) ඇතුළුව පුළුල් ලෙස පිළිගත් හැසිරීම් සංග්‍රහයන්, කැපවීම් සහ මූලික ප්‍රමිතීන්හි පදනම සාදයි.

# මානුෂීය මූලධර්ම සහ මූලික මානුෂීය ප්‍රමිතිය

මූලික මානුෂීය ප්‍රමිතිය යනු අර්බුදවලින් පීඩාවට පත් වූ ජනතාවට මානුෂීය සංවිධාන ගුණාත්මක ආධාර ලබා දෙන බව සහතික කිරීම සඳහා නිර්මාණය කර ඇති කැපවීම් සහ ඒ ආශ්‍රිත මාර්ගෝපදේශ සමූහයකි.

මෙම ප්‍රමිතීන් මූලික මානුෂීය මූලධර්ම වන මනුෂ්‍යත්වය, අපක්ෂපාතීත්වය, මධ්‍යස්ථභාවය, ස්වාධීනත්වය යන හතරෙහි සෘජු ප්‍රතිඵලයකි. මෙම සම්බන්ධතාවය සම්පූර්ණයෙන් අවබෝධ කර ගැනීම සඳහා, මානුෂීය සංවිධාන සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩලය මෙම මූලධර්ම මූලික මානුෂීය ප්‍රමිතියේ දක්වා ඇති මෙහෙයුම් රාමුව සහ සදාචාරාත්මක ප්‍රවේශය දැනුවත් කරන ආකාරය ගවේෂණය කිරීම අත්‍යවශ්‍ය වේ. මෙම සම්බන්ධතාවය සම්පූර්ණයෙන් අවබෝධ කර ගැනීම සඳහා, මානුෂීය සංවිධාන සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩලය මූලික මානුෂීය ප්‍රමිතියේ දක්වා ඇති මෙහෙයුම් රාමුව (operational framework) සහ සදාචාරාත්මක ප්‍රවේශයට (ethical approach) මෙම මූලධර්ම දායක වන ආකාරය ගවේෂණය කිරීම අත්‍යවශ්‍ය වේ.

## මනුෂ්‍යත්වය සහ මූලික මානුෂීය ප්‍රමිතිය

මනුෂ්‍යත්වය පිළිබඳ මානුෂීය මූලධර්මය (Humanitarian Principle of Humanity) මගින් මිනිස් දුක් වේදනා සමනය කිරීම, ජීවිතය සහ සෞඛ්‍යය ආරක්ෂා කිරීම සහ ගෞරවය ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරනු ලැබේ. මෙම මූලධර්මය, අර්බුදයෙන් පීඩාවට පත් ප්‍රජාවන්ගේ යහපැවැත්මට ප්‍රමුඛත්වය දීම කෙරෙහි අවධානය යොමු කරන මූලික මානුෂීය ප්‍රමිතියේ ප්‍රමිතීන් කිහිපයක් පදනම් කරගෙන ඇත. උදාහරණයක් ලෙස, මූලික මානුෂීය ප්‍රමිති හා සම්බන්ධ පළමුවන එකඟතාවය වන "මානුෂීය ප්‍රතිචාරය යනු අවශ්‍යතා මත පදනම් වූ සහ අදාළතාවයෙන් යුක්ත වේ" යන්න, බලපෑමට ලක් වූ ප්‍රජාවන්ගේ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා මානුෂීය අත්‍යවශ්‍යතාවයට අනුකූල වන අතර, ආධාර ඔවුන්ගේ ක්ෂණික අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වන බවත් තවදුරටත් හානි වැළැක්වීම සඳහා සැලසුම් කර ඇති බවත් සහතික කරනු ලබයි.

## අපක්ෂපාතීත්වය සහ මූලික මානුෂීය ප්‍රමිතිය

අපක්ෂපාතීත්වය යන්නෙන් අදහස් කරන්නේ ජාතිකත්වය, ජාතිය, ආගම හෝ වෙනත් සාධක මත පදනම් වූ වෙනස්කම් කිරීමකින් තොරව අවශ්‍යතාව මත පදනම්ව ආධාර සැපයිය යුතු බවයි. මූලික මානුෂීය ප්‍රමිතිය මෙම මූලධර්මය අවධාරණය කරන්නේ මානුෂීය ආධාර සඳහා සාධාරණ සහ අපක්ෂපාති ප්‍රවේශය ප්‍රවර්ධනය කරන ප්‍රමිතීන් හරහා ය. මූලික මානුෂීය ප්‍රමිති හා සම්බන්ධ නවවන එකඟතාවය වන "ප්‍රතිචාරය ඵලදායී හා කාලෝචිතයි" යන්න, තීරණ ගැනීමේ ක්‍රියාවලියක අවශ්‍යතා මත පදනම් වූ ප්‍රවේශයක වැදගත්කම ඉස්මතු කරමින්, ආධාර මුලින්ම පහසුවෙන් අවදානමට ලක්විය හැකි කණ්ඩායම් වෙත ළඟා වන බව සහතික කරමින් මෙයට සහාය වේ. මූලික මානුෂීය ප්‍රමිති හා සම්බන්ධ පස්වන එකඟතාවය වන "පැමිණිලි විසඳීමේ ක්‍රියාවලිය හැසිරවීමට ප්‍රතිචාරාත්මක යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම සහ ජනතාව ගැටළු සහ පැමිණිලි වාර්තා කිරීමට ආරක්ෂිත කොන්දේසි නිර්මාණය කිරීම" යන්න, මානුෂීය ආධාරවල සාධාරණත්වයේ වැදගත්කම අවධාරණය කරයි. එය බලපෑමට ලක් වූ ප්‍රජාවන්ට මානුෂීය ක්‍රියාවලිය තුළ ක්‍රියාකාරී සහභාගීත්වයක් ඇති බව සහතික කරන අතර සාධාරණ හා විනිවිද පෙනෙන පැමිණිලි කළමනාකරණයක් සහිතව පැමිණිලි සඳහා වාර්තා කිරීමේ මාර්ග වෙත ආරක්ෂිතව ප්‍රවේශ වීමට ඇති අයිතිය සහතික කරයි.

## මධ්‍යස්ථභාවය සහ මූලික මානුෂීය ප්‍රමිතිය

මධ්‍යස්ථභාවය යනු මානුෂීය සංවිධාන එදිරිවාදිකම් වලදී යම් පාර්ශවයක පැත්ත ගැනීමෙන් හෝ දේශපාලනික, වාර්ගික හෝ ආගමික වාද විවාද සහ මතභේදවලට සම්බන්ධ වීමෙන් වැළකී සිටීමයි. මෙම මූලධර්මය මූලික මානුෂීය ප්‍රමිතිය තුළ පිළිබිඹු වන අතර, මධ්‍යස්ථභාවය පවත්වා ගැනීම සහතික කරන මෙහෙයුම් මාර්ගෝපදේශය හරහා, මානුෂීය ප්‍රතිචාරය ගැටුමක් තුළ සිදුවන අන්තර්ක්‍රියා වල අඛණ්ඩ ක්‍රියාවලින් උග්‍රවීම වළක්වයි. උදාහරණයක් ලෙස, මූලික මානුෂීය ප්‍රමිති හා සම්බන්ධ නවවන එකඟතාවය වන “සම්පත් කළමනාකරණය කර සදාචාරාත්මකව සහ වගකීමෙන් යුතුව භාවිතා කරනු ලැබේ” යනු මානුෂීය ප්‍රතිචාර මගින් නොදැනුවත්වම ආතතීන් හෝ ගැටුම් ඇති කළ හැකි ක්‍රියා වළක්වා ගැනීම සහතික කිරීම සඳහා මූල්‍ය සම්පත් ඇතුළුව වගකිවයුතු ධාරිතාව සහ සම්පත් කළමනාකරණය සඳහා සුසංයෝගී සංවිධානාත්මක ප්‍රවේශයක් ඉල්ලා සිටීමයි. මේ ආකාරයෙන්, මධ්‍යස්ථභාවය තහවුරු කරනු ලබන අතර, අවධානය යොමු වන්නේ මානුෂීය අවශ්‍යතා සපුරාලීම කෙරෙහි පමණි.

## ස්වාධීනත්වය සහ මූලික මානුෂීය ප්‍රමිතිය

මානුෂීය ක්‍රියාමාර්ග දේශපාලන, ආර්ථික හෝ හමුදා න්‍යාය පත්‍රවල මැදිහත්වීම්වලින් තොරව ස්වාධීනව සිදු කළ යුතු බව ස්වාධීනත්වය පිළිබඳ මූලධර්මය අවධාරණය කරයි. මෙම මූලධර්මය බාහිර බලපෑම්වලින් තොරව, මානුෂීය අවශ්‍යතා මත පමණක් පදනම්ව සංවිධාන තීරණ ගන්නා බව සහතික කිරීමෙන් මූලික මානුෂීය ප්‍රමිතිය තහවුරු කරයි. උදාහරණයක් ලෙස, මූලික මානුෂීය ප්‍රමිති  හා සම්බන්ධ හතරවන එකඟතාවය වන “මානුෂීය ප්‍රතිචාරය සහභාගීත්වය සහ ප්‍රතිපෝෂණය මත පදනම් වේ” යන්න, බලපෑමට ලක් වූ ප්‍රජාවන් තීරණ ගැනීමේදී සම්බන්ධ වන බව සහතික කරයි, එමගින් බාහිර බලවේග ආධාර සැපයීමට බලපෑම් කිරීම වළක්වනු ලැබේ. ඊට අමතරව, මූලික මානුෂීය ප්‍රමිති  හා සම්බන්ධ  අටවන එකඟතාවය  වන  “මානුෂීය කාර්ය මණ්ඩලය දක්ෂ, ගෞරවනීය සහ හොඳින් කළමනාකරණය කරන ලද අය වෙති” යන්නෙන්, සංවිධානාත්මක වටිනාකම් සහ ප්‍රමිතීන්ට අනුකූලව දක්ෂ කාර්ය මණ්ඩලයක් සහ කළමනාකරණ ව්‍යුහයන් ස්ථාපිත කිරීම අවශ්‍ය වන අතර එමගින් මෙහෙයුම් ස්වාධීනත්වය සහ වගවීම යන දෙකම සහතික කෙරේ.

මූලික මානුෂීය ප්‍රමිතිය මෙම මූලධර්ම ක්‍රියාත්මක කරන්නේ ඵලදායී, අපක්ෂපාතී, මධ්‍යස්ථ සහ ස්වාධීන මානුෂීය ආධාර සැපයීමට මඟ පෙන්වීම සඳහා වන අතර, ආධාර සංවිධාන ප්‍රතිචාරයේ සෑම අදියරකදීම බලපෑමට ලක් වූ ප්‍රජාවන්ගේ  ගෞරවය සහ යහපැවැත්මට ප්‍රමුඛත්වය දෙන බව සහතික කරයි. මෙම මූලධර්ම පෞද්ගලික අංශය සඳහා රාමුවක් ද සපයන අතර, ඔවුන්ගේ මානුෂීය උත්සාහයන් ඔවුන් සේවය කරන ප්‍රජාවන්ගේ සියලුම අංශවලට ප්‍රතිචාර දක්වන බව සහතික කරයි.

# මූලික මානුෂීය ප්‍රමිතිය යනු කුමක්ද?

පෞද්ගලික අංශය විසින් සපයනු ලබන මානුෂීය ආධාරවල ගුණාත්මකභාවය, වගවීම සහ අනුකූලතාව සහතික කිරීම සඳහා, පොදුවේ එකඟ වූ මානුෂීය ප්‍රමිතීන් මාලාවක් ක්‍රියාත්මක වීම අත්‍යවශ්‍ය වේ. පැහැදිලිව නිර්වචනය කරන ලද මාර්ගෝපදේශ අනවශ්‍ය සහ අස්ථාවර හෝ අහිතකර ප්‍රතිඵලවලට තුඩු දිය හැකි ප්‍රවේශයන් මගහරිනු ලබයි. මූලික මානුෂීය ප්‍රමිතිය, අර්බුදවලින් පීඩාවට පත් පුද්ගලයින් සහ ප්‍රජාවන්, ඒකාබද්ධ කිරීමට පහසුකම් සපයන අතර මානුෂීය ක්‍රියාකාරීන්ගේ කැපවීම් පිළිබඳව ඔවුන් දැනුවත් කරමින් සහ ඔවුන්ගේ ක්‍රියාවන් සඳහා මෙම මානුෂීය මෙහෙයුම් ක්‍රියාකාරීන් වගකිව යුතු බවට පත් කිරීමට ඔවුන්ට හැකියාව ලබා දෙයි.

මූලික මානුෂීය ප්‍රමිතිය, මානුෂීය ප්‍රතිචාර දැක්වීමේ නිරත පෞද්ගලික අංශයේ සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන ඇතුළුව, ඵලදායී මානුෂීය ආධාරවල නිරත වීමට සහ ධනාත්මක ප්‍රතිඵල අත්කර ගැනීමට අනුගමනය කළ හැකි එකඟතාවයන් නවයකින් සමන්විත වේ. මෙමඟින් අර්බුදකාරී තත්ත්වයන්ට මුහුණ දුන් පුද්ගලයින් සහ ප්‍රජාවන් ඒකාබද්ධ කිරීම වේගවත් කර, මානුෂීය ක්‍රියාකාරීන්ගේ කැපවීම් පිළිබඳව ඔවුන් දැනුවත් කරන අතර මෙම ක්‍රියාකාරීන් ඔවුන්ගේ ක්‍රියාවන් සඳහා වගකිව යුතු බවට පත් කිරීමට ඔවුන්ට හැකියාව ලැබේ. මූලික මානුෂීය ප්‍රමිති බැඳීම් කිසිදු වැඩසටහන් චක්‍රයකට විශේෂිත නොවන බව මානුෂීය සංවිධාන තේරුම් ගත යුතුය. ඒවා අර්බුදයක සියලු අවධීන් හරහා ප්‍රතිචාර සහ වැඩසටහන් මට්ටම් දෙකෙහිම යෙදිය හැකිය. සෑම එකඟතාවයකටම ගුණාත්මක නිර්ණායකයක්, කාර්ය සාධන දර්ශක, ප්‍රධාන ක්‍රියාමාර්ග සහ සංවිධානාත්මක වගකීම් ඇතුලත් කොට ඇත.



# මූලික මානුෂීය ප්‍රමිති හා සම්බන්ධ ඒකාග්‍රතා නවයේ අන්තර්ගතය

පෞද්ගලික අංශයේ මානුෂීය ආධාර

1. ප්‍රජාවේ සැබෑ සහ නිශ්චිත අවශ්‍යතා මත පදනම් විය යුතුය.

2. ඵලදායී, හොඳින් කළමනාකරණය කළ යුතු අතර නිසි වේලාවට සැපයිය යුතුය.

3. අවදානම අඩු කර වඩා හොඳ සූදානමක් සහ ඔරොත්තු දීමේ හැකියාව සඳහා පහසුකම් සැලසිය යුතුය.

4. ජනතාව බලගැන්විය යුතු අතර ඔවුන් සහාය ක්‍රියාවලියට ඒකාබද්ධ කළ යුතුය.

5. පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ප්‍රතිචාරාත්මක සහ ආරක්ෂිත යාන්ත්‍රණ ස්ථාපිත කළ යුතුය.

6. ජනතාවට හොඳින් සම්බන්ධීකරණය කරන ලද මානුෂීය ආධාර ලැබෙන බව සහතික කළ යුතුය.

7. අත්දැකීම් තුලින් ලබාගන්නා අත්දැකීම් සහ පළපුරුද්ද තුළින් වැඩසටහන් වැඩිදියුණු කිරීම සහතික කළ යුතුය.

8. දක්ෂ, ගෞරවනීය සහ හොඳින් කළමනාකරණය කරන ලද කාර්ය මණ්ඩලයක් විසින් ලබා දිය යුතුය.

9. සම්පත් කළමනාකරණය සදාචාරාත්මකව සහ වගකීමෙන් යුතුව සිදු කරන බව සහතික කළ යුතුය.

# මානුෂීය ක්‍රියාමාර්ගවලට පෙර පෞද්ගලික අංශයේ ක්‍රියාකාරකම්

මානුෂීය ක්‍රියාමාර්ගයක් ආරම්භ කිරීමට පෙර මානුෂීය ආධාර ප්‍රයත්නයේ අදාළත්වය පිළිබඳව මෙනෙහි කිරීම පෞද්ගලික අංශයේ සංවිධානයට වැදගත් වේ.එවැනි මානුෂීය මැදිහත්වීම සමාගමේ මෙහෙවර, දැක්ම සහ මූලික වටිනාකම් තුළ තිබිය යුතුය. මෙම සන්දර්භය තුළ, සංවිධානය මගින් පහත සඳහන් ප්‍රශ්න ඇසීම සුදුසු වනු ඇත:

1. සමාගමේ / ආයතනයේ මෙහෙවර, දැක්ම කුමක්ද?

2. සමාගමට / ආයතනයට මඟ පෙන්වන මූලික වටිනාකම් සහ මූලධර්ම මොනවාද?

3. යෝජිත මානුෂීය ක්‍රියාමාර්ගය එහි මෙහෙවර, දැක්ම, ඉලක්ක සහ මූලික වටිනාකම් වලට සාපේක්ෂව කෙතරම් අදාළද?

**සූදානම් කිරීමට අවශ්‍ය ක්‍රියා, කාර්යයන් හෝ සුදුසුකම් :**

- මානුෂීය ක්‍රියාමාර්ග හැසිරවීම සඳහා සහයෝගීතාවයෙන් එක්ව ක්‍රියාත්මක වන කණ්ඩායමක් සකස් කිරීම.
- සමාගමේ ආයතනික අගයන් අනුව අපේක්ෂිත මානුෂීය ක්‍රියාමාර්ගයේ අදාළත්වය තේරුම් ගැනීමට හැකි ආකාරයෙන් අදහස් ඉදිරිපත් කිරීම සඳහා කණ්ඩායම් සාකච්ඡාවක් පැවැත්වීම.
- අපේක්ෂිත මානුෂීය ආධාර සැලැස්ම පිළිබඳව බලපෑමට ලක් වූ ප්‍රජාව සමඟ සාකච්ඡා කිරීම.
- සැලැස්ම පිළිබඳව අදාළ රජයේ බලධාරීන්ගෙන් විමසීම.
- "ආපදාවක බලපෑම" තේරුම් ගැනීමට සහ සැබෑ අවශ්‍යතා හඳුනා ගැනීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, අනෙකුත් අදාළ රාජ්‍ය ආයතන හෝ රාජ්‍ය නොවන සංවිධාන / ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන වෙතින් කරන ලද අවශ්‍යතා පිළිබඳ ඇගයීම්වල සහ ආපදාවේ බලපෑම පිළිබඳ විස්තර ලබා ගැනීම.
- සංවිධානයට හැකියාවක් තිබේ නම්, ආපදාවෙන් බලපෑමට ලක් වූ ප්‍රජාවන්ගේ සැබෑ අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා අවශ්‍යතා පිළිබඳ ඇගයීමක් පැවැත්වීමට හැකිය.
- සැපයීමට අපේක්ෂිත ආධාර පිළිබඳ තීරණ,අවශ්‍යතා පිළිබඳ ඇගයීම මත පදනම් වන බවට සහතික කිරීම.
- ආපදාවක බලපෑමට ලක්වූ පිරිස් සඳහා දෙනු ලබන මානුෂීය ආධාරවල ස්වභාවය පෞද්ගලික අංශයට අයත් සංවිධානයේ මෙහෙවර, දැක්ම සහ ආයතනික අගයන්ට අනුකූල වන බව තහවුරු කර ගැනීම.
- තත්ත්වය සහ පවතින සම්පත් මත පදනම්ව, ආධාර වඩා හොඳින් ලබා දීම සඳහා අනෙකුත් පෞද්ගලික අංශ සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමේ අවශ්‍යතාවයක් තිබේද යන්න තීරණය කිරීම.
- මානුෂීය ආධාර සැලැස්ම ක්‍රියාත්මක කිරීම.
- ප්‍රගතිය නිරීක්ෂණය කර පසුවිපරම ලෙස ලැබී ඇති තොරතුරු භාවිතා කරමින් අවශ්‍ය වෙනස්කම් සිදු කිරීම.
- අඛණ්ඩ කාර්යක්ෂමතාව, ගුණාත්මකභාවය සහ වටිනාකම් වැඩිදියුණු කිරීම සඳහා අත්දැකීම් වලින් ඉගෙන ගන්නා ලද ප්‍රතිඵල ඇගයීම.

# මූලික ඒකාග්‍රතාවය

## ඒකාග්‍රතාවය 01

මානුෂීය ආධාර, බලපෑමට ලක් වූ ප්‍රජාවේ සැබෑ සහ නිශ්චිත අවශ්‍යතා හා ප්‍රමුඛතා මත පදනම් විය යුතුය.

### මානුෂීය ආධාර පිළිබඳ ගුණාත්මක නිර්ණායකය

මානුෂීය ප්‍රතිචාර, අවශ්‍යතා මත පදනම් වන අතර අදාළතාවයෙන් යුක්ත වේ.

### අවශ්‍යතා සහ මාර්ගෝපදේශ

**1.1** අවශ්‍යතා මත පදනම් වූ සේවා විධිවිධාන

අවශ්‍යතා පිළිබඳ විධිමත් ඇගයීමක් පැවැත්වීමෙන් හෝ අවශ්‍යතා පිළිබඳ විධිමත් ඇගයීමක් කළ නොහැකි විට අදාළ බලධාරීන් සහ කොටස්කරුවන් සමඟ සම්බන්ධීකරණය කිරීම හරහා, ස්වාභාවික විපත්, මිනිසා විසින් සාදන ලද හදිසි අවස්ථා, හෝ සංකීර්ණ හදිසි අවස්ථා වැනි මානුෂීය අර්බුදයකින් සෘජුව හෝ වක්‍රව බලපෑමට ලක් වූ ප්‍රජාවන්ගේ සැබෑ සහ නිශ්චිත අවශ්‍යතා සපුරාලන බවට පෞද්ගලික සංවිධාන සහතික විය යුතුය.

**1.2** අවශ්‍යතා පිළිබඳ විධිමත් ඇගයීමක් පැවැත්වීම

ආයතන විසින් ඉලක්ක කණ්ඩායම්, සමීක්ෂණ සහ උපදේශන වැනි ක්‍රම භාවිතා කරමින් පුළුල් අවශ්‍යතා තක්සේරු කිරීම් (ගුණාත්මක සහ ප්‍රමාණාත්මක යන දෙකම) සිදු කළ යුතුය. එවැනි විධිමත් තක්සේරු කිරීම් කළ නොහැකි විට, රජයෙන් සහ සමාජ හවුල්කරුවන්ගෙන් ලබා ගත හැකි දත්ත භාවිතා කරමින් ඇගයීමක් සිදු කළ යුතුය

**1.3** ආපදා ආශ්‍රිත තොරතුරු උපයෝගී කර ගැනීම

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ අනෙකුත් අදාළ රජයේ බලධාරීන් ඇතුළු විශ්වාසදායක මූලාශ්‍රවලින් ආපදා සම්බන්ධ දත්ත රැස් කර ගත යුතු අතර, එමඟින් විනාශයේ ප්‍රමාණය සහ බලපෑමට ලක් වූ ප්‍රජාවන්ගේ නිශ්චිත අවශ්‍යතා අවබෝධ කර ගත හැකිය.

## 1.4 ඒකාබද්ධ සහ සියලු දෙනා ඇතුළත් ප්‍රවේශය / පිවිසුම

අවශ්‍යතා පිළිබඳ විධිමත් ඇගයීමේ සොයාගැනීම් මත පදනම්ව, සංවිධාන විවිධ කණ්ඩායම්වල පහසුවෙන් අවදානමට ලක් වියහැකි විවිධ තත්ත්වයන් හැකියාවන් සැලකිල්ලට ගන්නා ඒකාබද්ධ ප්‍රවේශයක් වර්ධනය කර ක්‍රියාත්මක කළ යුතු අතර, විශේෂයෙන් සමාජයෙන් කොන්විය හැකි ආන්තික ප්‍රජාවන් කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

## 1.5 විකල්ප අවශ්‍යතා හඳුනා ගැනීම

අවශ්‍යතා පිළිබඳ විධිමත් ඇගයීමක් පැවැත්වීමට නොහැකි නම්, පහසුවෙන් අවදානමට ලක් වියහැකි හෝ ස්වාභාවික විපත්, මිනිසා විසින් සාදන ලද හදිසි අවස්ථා හෝ සංකීර්ණ හදිසි අවස්ථා වැනි මානුෂීය අර්බුදයකින් ඍජුව හෝ වක්‍රව බලපෑමට ලක් වූ ප්‍රජාවන්ගේ සැබෑ අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා පෞද්ගලික සංවිධාන රජයේ බලධාරීන්, ප්‍රජා නායකයින් සහ රාජ්‍ය නොවන සංවිධාන සහ අනෙකුත් පෞද්ගලික ආයතන වැනි කොටස්කරුවන් සමඟ සම්බන්ධීකරණය වීම තුලින් කළ යුතුය. ආපදා සිතියම්, හදිසි ප්‍රතිචාර සැලසුම් සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සහ රජයේ බලධාරීන්ගෙන් ලබාගත් අනෙකුත් අදාළ දත්ත වැනි පවතින සම්පත් උපයෝගී කර ගැනීමෙන් මෙම ක්‍රියාවලියට තවදුරටත් සහාය විය හැකිය.

## 1.6 ආධාර ලබාදීම සඳහා වූ සාධාරණ සහ විනිවිද පෙනෙන නිර්ණායක

වැඩසටහන් නිර්වචනය කිරීමේදී සහ ප්‍රතිලාභී ප්‍රජාවන් තෝරා ගැනීමේදී සංවිධාන සාධාරණ, අපක්ෂපාතී සහ විනිවිද පෙනෙන නිර්ණායක භාවිතා කළ යුතුය. බලපෑමට ලක් වූ ප්‍රජාවන්හි අවශ්‍යතා ඵලදායී ලෙස සපුරාලීම සහතික කිරීම සඳහා සියලුම වැඩසටහන් අදාළ තාක්ෂණික ප්‍රමිතීන් සපුරාලිය යුතු අතර මානුෂීය ආධාරවල පිළිගත් හොඳම පිළිවෙත් ද පිළිපැදිය යුතුය.

## ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහ නඩත්තු කිරීමට අවශ්‍ය ප්‍රායෝගික අංශ සහ අවශ්‍යතා සලකා බැලීම:

පෞද්ගලික අංශය අවශ්‍යතා පිළිබඳ ඇගයීමක් කිරීමට සම්බන්ධ වන්නේ නම්, ඔවුන් ජලය, සනීපාරක්ෂාව, ආහාර සුරක්ෂිතතාව, නවාතැන් සහ සෞඛ්‍යය වැනි ක්ෂේත්‍රවල මානුෂීය ආධාරවල ගුණාත්මකභාවය සහ වගවීම වැඩිදියුණු කිරීම අරමුණු කරගත්, මානුෂීය ප්‍රතිචාරයේ මූලධර්ම සහ අවම ප්‍රමිතීන් වැනි පිළිගත් ප්‍රමිතීන් හෝ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් සකස් කරන ලද කඩිනම් අවශ්‍යතා තක්සේරු මාර්ගෝපදේශය වැනි දේශීය මාර්ගෝපදේශ වෙත යොමු විය යුතුය.

- අවශ්‍යතා පිළිබඳ ඇගයීමක් පැවැත්වීම සඳහා, පෞද්ගලික අංශයට බාහිර උපදේශකයෙකු බඳවා ගැනීමට හෝ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, රාජ්‍ය නොවන සංවිධාන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන ආදියෙන් ලබා ගත හැකි වාර්තා භාවිතා කරමින් ලේඛන, දත්ත හෝ තොරතුරු පිළිබඳ ගැඹුරු පරීක්ෂණයක් හෝ විශ්ලේෂණයක් (desk review) පැවැත්විය යුතුය.
- වැඩසටහන් අදාළත්වය සහතික කිරීම සහ සැලසුම් සහාය සඳහා අවශ්‍යතා පිළිබඳ ඇගයීම පදනමක් ලෙස භාවිතා කිරීම.
- ආධාර වැඩසටහනේ දී ප්‍රජාවේ සැබෑ අවශ්‍යතා හඳුනාගෙන ඒවාට විසඳුම් ලබාදීම.
- අනෙකුත් මානුෂීය සංවිධාන විසින් අවධානය යොමු කර නොමැති, බලපෑමට ලක් වූ ප්‍රජාවේ සපුරා නොමැති අවශ්‍යතා සලකා බැලීම.
- සමාගම / සංවිධානය සතුව ඇති සම්පත් සහ හැකියාව සැලකිල්ලට ගෙන, අපේක්ෂිත මානුෂීය ආධාර ලබා දීමට හැකියාව තිබේදැයි ඇගයීම.
- පුද්ගලයන්ට සහ ප්‍රජාවන්ට ආපදාවෙන් ඇතිවන බලපෑම්වල බරපතලකම තක්සේරු කිරීම.
- පවතින සම්පත් සහ හැකියාවන් නිසි ලෙස ඇගයීමට ලක්කිරීම.
- ස්ත්‍රී පුරුෂ භාවය, වයස, ජනවාර්ගිකත්වය සහ විවිධ අවදානම් මට්ටම් මත පදනම් වූ අවශ්‍යතා තේරුම් ගැනීම.

"මානුෂීය ක්‍රියාමාර්ග බලපෑමට ලක් වූ ප්‍රජාවන්ගේ අවශ්‍යතා මත පදනම් විය යුතු අතර, ඇගයීම් නිශ්චිත අවශ්‍යතා තේරුම් ගැනීමට සහ සුදුසු ප්‍රතිචාර ලබා දීමට පදනම සාදයි. "වින්දිතයින්ගේ අවශ්‍යතාවලට ප්‍රමුඛත්වය දීම අත්‍යවශ්‍ය වන අතර, ආධාර ප්‍රජාව විසින් නිර්වචනය කරන ලද දේශීය සන්දර්භයන් සහ ප්‍රමුඛතා සමඟ අනුකූල වන බව සහතික කරයි."

.................................................

Source: Sphere Association (2018) The Sphere Handbook (Humanitarian Charter and Minimum standards in Humanitarian Response. Geneva, Switzerland: Sphere Association

ඒකශතාවය

# 02

සහනාධාර ඵලදායී විය යුතු අතර හොඳින් කළමනාකරණය කර නියම වේලාවට ලබා දිය යුතුය.

## මානුෂීය ආධාර පිළිබඳ ගුණාත්මක නිර්ණායකය

"මානුෂීය ප්‍රතිචාරය ඵලදායී හා කාලෝචිත වේ"

## අවශ්‍යතා සහ මාර්ගෝපදේශ

### 2.1 අතිශය වැදගත්කමක් ඇති සහ වහා අවධානය යොමුකිරීම අවශ්‍ය වන තත්වයන් (critical needs) සඳහා ප්‍රමුඛතාවය දීම

ආපදා අවස්ථාවන්හිදී, ජීවිත බේරා ගැනීමට සහ වේගවත් සුවය ලැබීමට සහාය වීමට ඉතා බරපතල තත්වයක සිටින පුද්ගලයාගේ සහ ප්‍රජාවේ අවශ්‍යතාවයන්ට ප්‍රමුඛත්වය දී, විශාලතම ක්ෂණික බලපෑමක් ඇති මැදිහත්වීම් කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

### 2.2 කාලෝචිත ප්‍රතිචාර දැක්වීම සහ තීරණ ගැනීම

බලපෑමට ලක් වූ ප්‍රජාවන්ගේ ක්ෂණික අවශ්‍යතාවලට ආධාර අදාළ බව සහතික කරමින්, රජයේ බලධාරීන් සමඟ තක්සේරු කිරීම සහ සම්බන්ධීකරණය මත පදනම්ව, මානුෂීය ආධාර කඩිනමින් සහ සුදුසු වේලාවට ලබා දිය යුතුය.

### 2.3 බලපෑමට ලක් වූ ව්‍යවසායන් සඳහා ව්‍යාපාර අඛණ්ඩතාව

ව්‍යසනයෙන් ව්‍යාපාරවලටම බලපෑම් ඇති වුවහොත්, ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගැනීමට සහ පුළුල් ප්‍රජා ප්‍රතිචාරයට සහාය වීම සඳහා ව්‍යාපාර මෙහෙයුම් වේගවත් ලෙස යථා තත්ත්වයට පත් කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ප්‍රමුඛත්වය දිය යුතුයි.

### 2.4 අඛණ්ඩ අධීක්ෂණය සහ අනුවර්තනය

කාලෝචිත, ඵලදායී ප්‍රතිචාර සහතික කිරීම සහ කාර්ය ඉටු කිරීමේ ක්‍රියාව හෝ ක්‍රියාවලිය සහ නව තත්වයන්ට අනුවර්තනය වීමට කාලයත් සමඟ ක්‍රමයෙන් වෙනස් වන හෝ වර්ධනය වන අවශ්‍යතා (evolving needs) මත පදනම්ව වැඩසටහන් අනුවර්තනය කිරීම සඳහා සංවිධාන මානුෂීය ක්‍රියාකාරකම් අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ නිතිපතා ඇගයීම ක්‍රියාත්මක කළ යුතුය.

## 2.5 ඉටු නොවූ හදිසි අවශ්‍යතා සඳහා නිර්දේශ කිරීම

කිසියම් හදිසි මානුෂීය අවශ්‍යතා සාධාරණ කාල රාමුවක් තුළ විසඳා ගැනීමට සංවිධානයට ඇති හැකියාවෙන් ඔබ්බට ගියහොත්, එම අවශ්‍යතා අදාළ නිපුණතාව සහ බලතල ඇති පෞද්ගලික අංශයේ වෙනත් සංවිධාන හෝ ජාල වෙත යොමු කළ යුතුය.

## 2.6 උනන්දුවක් දක්වන පුද්ගලයින් හෝ කණ්ඩායම් හඳුනා ගැනීම සහ විශ්ලේෂණය කිරීම

මානුෂීය ආධාර කාර්යක්ෂමව ලබා දීම සහතික කිරීම සඳහා ක්‍රියාවලින් තුළට පාර්ශවකරුවන්ගේ සිතියම්ගත කිරීම (ව්‍යාපෘතියක හෝ ව්‍යාපාර මුලපිරීමක උනන්දුවක් ඇති පිරිස් හඳුනා ගැනීම, විශ්ලේෂණය කිරීම (stakeholder mapping) ඇතුළත් කළ යුතු අතර කාලෝචිත හා ඵලදායී සේවා සැපයීමට පහසුකම් සැලසීම සඳහා රජය සහ අනෙකුත් පාර්ශවකරුවන් සමඟ නිසි සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම අවශ්‍ය වේ.

## 2.7 නිතිපතා වැඩසටහන් ඇගයීම සහ අනුකලනයවීම

මානුෂීය ක්‍රියාමාර්ග කාලෝචිත විය යුතු අතර, ප්‍රවේශ විය හැකි සහ බලපෑමට ලක් වූ හෝ අවදානමට ලක්විය හැකි පුද්ගලයින්ගේ සහ ප්‍රජාවන්ගේ ප්‍රමුඛතා සහ අවශ්‍යතා ඵලදායී ලෙස සපුරාලීම සහතික කිරීම සඳහා වැඩසටහන් නිතිපතා නිරීක්ෂණය කර සකස් කර ගැනීම වැදගත් වේ.

## ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහ නඩත්තු කිරීමට අවශ්‍ය ප්‍රායෝගික අංශ සහ අවශ්‍යතා සලකා බැලීම:

- මානුෂීය ආධාර කාර්යක්ෂමව ලබා දීම වැඩිදියුණු කිරීම සඳහා පෞද්ගලික අංශය විසින් පාර්ශ්වකරුවන්ගේ සිතියම්කරණය (Stakeholder mapping) සිදු කළ යුතුය.
- මානුෂීය ආධාර ඵලදායී හා කාර්යක්ෂමව ලබා දීම සහතික කිරීම සඳහා ආබාධ කළමනාකරණ මධ්‍යස්ථානය, අනෙකුත් රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සමඟ සම්බන්ධීකරණය විය යුතුය.
- යථාර්ථවාදී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා පෞද්ගලික අංශය මුහුණපෑමට සිදුවන ආයතනික සීමාවන් ආමන්ත්‍රණය කළ යුතු අතර වැඩසටහන් චක්‍රය පුරාවට නිශ්චිත ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය.
- මානුෂීය ආධාර අපේක්ෂිත ලෙස ලබා දෙනු ලැබේදැයි පරීක්ෂාකර බැලීමට සහ ස්ථාපිත ඉලක්ක වලට එරෙහිව ආධාර චලනය නිරීක්ෂණය කිරීම සඳහා පද්ධති ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ ස්ථාපිත ඉලක්ක වලට එරෙහිව ආධාර යොමු කර ඇති බව නිරීක්ෂණය කිරීම අවශ්‍යව ඇත.
- සංවිධානය තුළ වගකීම් සහ තීරණ ගැනීමේ ක්‍රියාවලීන් පැහැදිලිව නිර්වචනය කර සියලුම සාමාජිකයින් ඔවුන්ගේ පුද්ගලික වගකීම් සහ ආයතනික ක්‍රියා පටිපාටි පිළිබඳව හොඳින් දැනුවත් බව සහතික කළ යුතුය.
- මානුෂීය ආධාර ලබා දීම සඳහා සම්බන්ධ වන පෞද්ගලික අංශයේ සංවිධාන මානුෂීය ක්‍රියාමාර්ගවල ප්‍රගතිය ලේඛනගත කළ යුතු අතර අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සඳහා ක්‍රමානුකූල, දැඩි අධීක්ෂණය සහ ඇගයීම ක්‍රියාත්මක කළ යුතුය.

"රාජ්‍ය හෝ පෞද්ගලික ක්‍රියාකාරීන් විසින් සපයනු ලබන මානුෂීය ආධාරවල, බලපෑම උපරිම කර ගැනීම සඳහා, නිශ්චිත ස්ථානයක හෝ තත්වයක සිටින පුද්ගලයින්ට ඇති අත්‍යවශ්‍යතා හෝ අවශ්‍යතා කාර්යක්ෂමව, හොඳින් සම්බන්ධීකරණය කළ යුතුය. ජීවිත බේරා ගැනීමට සහ දුක් වේදනා සමනය කිරීමට කාලෝචිත ප්‍රතිචාර දැක්වීම ඉතා වැදගත් වන අතර, ඒ සඳහා සම්බන්ධ වන සියලුම පාර්ශවකරුවන් අතර ශක්තිමත් කළමනාකරණයක් සහ සම්බන්ධීකරණයක් අවශ්‍ය වේ."

………………………………….

Source: United Nations Office for the Coordination of Humanitarian Affairs (OCHA). (2020). Global Humanitarian Overview. New York: OCHA.

එකඟතාවය

# 03

ආධාර මගින් අර්බුදයකට තුඩු දිය හැකි තත්වයන් හෝ සිදුවීම් ඇතිවීමේ අවදානම අඩු කළ යුතු අතර ජනතාවට වඩා හොඳින් සූදානම් වීමට සහ ඔරොත්තු දීමේ හැකියාව ලබා දිය යුතුය.

## ගුණාත්මක නිර්ණායකය

මානුෂීය ප්‍රතිචාරය අවදානම අඩු කරන අතර ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කරයි.

## අවශ්‍යතා සහ මාර්ගෝපදේශ

### 3.1 දේශීය හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීම

පෞද්ගලික අංශය විධිමත් සහ අවිධිමත් ප්‍රජා නායකයින් සමඟ සහයෝගයෙන් කටයුතු කළ යුතු අතර දේශීය වශයෙන් මෙහෙයවනු ලබන මානුෂීය ක්‍රියාමාර්ගවලට සහාය වීම සඳහා හවුල්කාරිත්වයන් ඇති කර ගත යුතුය. මෙම උත්සාහයන් ආපදාවන්ට ගොදුරු වන පුද්ගලයින්ගේ සහ ප්‍රජාවන්ගේ ධාරිතාව සහ ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම අරමුණු කරයි.

### 3.2 නව අවදානම් වළක්වා ගැනීම

පෞද්ගලික අංශය විසින් ගනු ලබන මානුෂීය ක්‍රියාමාර්ග මඟින් පවතින අවදානම් අඩු කළ යුතු අතර නව අවදානම් ඇතිකර ගැනීමෙන් කිරීමෙන් වැළකී සිටිය යුතුය. එනම්, ජනතාවගේ සුරක්ෂිතභාවය, ආරක්ෂාව, ගෞරවය සහ අයිතිවාසිකම් කාර්ය මණ්ඩලය මගින් සිදුවිය හැකි ලිංගික සූරාකෑම සහ අපයෝජනය; සහ සංස්කෘතිය, ස්ත්‍රී පුරුෂ භාවය, සමාජීය සහ දේශපාලනික සබඳතා, ජීවනෝපායන්, දේශීය ආර්ථිකය, එන්නත් පැකිලීම සහ පරිසරය, යන කරුණු මත ඇති විය හැකි අවධානම් අවම කළ යුතුය.

### 3.3 දේශීය සම්පත්වලට ප්‍රමුඛත්වය දීම

හැකි සෑම විටම, ප්‍රදේශයට පිටතින් සම්පත් ලබා ගැනීමට වඩා දේශීය සම්පත් භාවිතයට ප්‍රමුඛත්වය දීම වැදගත්වේ. මානුෂීය අරමුණු සඳහා අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම සඳහා දේශීය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සමඟ හවුල් වී, එමගින් දේශීය ආර්ථිකයට සහාය ලබා දිය යුතුයි.

## 3.4 සහයෝගී සේවා ප්‍රතිසංස්කරණය

අත්‍යවශ්‍ය සේවාවන් කඩිනමින් යථා තත්ත්වයට පත් කිරීම සඳහා රජයේ බලධාරීන්, අනෙකුත් රාජ්‍ය නොවන සංවිධාන සහ අර්බුදයෙන් පීඩාවට පත් ජනතාව සමග සමීපව කටයුතු කළ යුතු අතර, හදිසි අවස්ථාවන් සඳහා සැලසුම් කර ඇති වැඩසටහන් නිමවීමෙන් පසුවද  මෙම සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කළ යුතුයි. බලපෑමට ලක් වූ ප්‍රජාවට කල් පවතින ධනාත්මක බලපෑම් සුරක්ෂිත කිරීම සඳහා ඉවත් වීමේ හෝ පිටවීමේ උපාය මාර්ගයක් මානුෂීය ක්‍රියාකාරී සැලසුම්වලට ඇතුළත් විය යුතුය.

## ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහ නඩත්තු කිරීමට අවශ්‍ය ප්‍රායෝගික අංශ සහ අවශ්‍යතා සලකා බැලීම:

- මානුෂීය ක්‍රියාමාර්ගවලට සම්බන්ධ විවිධ කොටස්කරුවන්ගේ භූමිකාවන්, වගකීම්, හැකියාවන් සහ අවශ්‍යතා පෞද්ගලික සංවිධාන තේරුම් ගත යුතුය.
- මානුෂීය ප්‍රතිචාරය ජාතික හා පළාත් පාලන ආයතනවල මෙන්ම අනෙකුත් මානුෂීය සංවිධානවල උත්සාහයන්ට අනුපූරක වන බව සහතික කිරීම.
- අනුකලනය වීම වළක්වා ගැනීම සඳහා සුදුසු සන්නිවේදන මාර්ග හරහා හවුල්කරුවන්, සම්බන්ධීකරණ කණ්ඩායම් සහ අනෙකුත් අදාළ සංවිධාන සමග අවශ්‍ය තොරතුරු බෙදා ගත යුතුය.
- පුනරාවර්තනය වළක්වා ගැනීමට සහ මානුෂීය ප්‍රතිචාරයේ හොඳම පිළිවෙත් ප්‍රවර්ධනය කිරීමට සුදුසු සන්නිවේදන මාර්ග හරහා හවුල්කරුවන්, සම්බන්ධීකරණ කණ්ඩායම් සහ අනෙකුත් අදාළ සංවිධාන සමග අවශ්‍ය තොරතුරු බෙදා ගැනීම කළ යුතුය.
- අපක්ෂපාතීත්වය, ස්වාධීනත්වය, විශ්වසනීයත්වය, ආරක්ෂාව සහ බලපෑමට ලක් වූ ප්‍රජාවන් වෙත ප්‍රවේශය ආරක්ෂා කිරීම සඳහා මානුෂීය සංවිධාන හමුදා ආයතනවලින් පැහැදිලි වෙනසක් පවත්වා ගත යුතුය.
- බලධාරීන් ගැටුමක පාර්ශවකරුවන් වන විට, මානුෂීය සංවිධාන විසින් බලධාරීන්ගේ ස්වාධීනත්වය සම්බන්ධයෙන් ඔවුන්ගේ විනිශ්චය සහ  නීති  මත පදනම්ව තීරණ ගැනීමට ඇති නිදහස  භාවිතා කරමින් කටයුතු කළ යුතු අතර,  තීරණ ගැනීමේදී, බලපෑමට ලක් වූ ජනතාවගේ අවශ්‍යතා මූලික වශයෙන් සලකා බැලිය යුතුය.
- හුදකලාව නොව, සමස්තයක් ලෙස ජනතාවගේ අවශ්‍යතා සපුරාලීම (උදා: විශේෂඥයින් සම්බන්ධ වන තාක්ෂණික වැඩ කණ්ඩායම් හරහා සෞඛ්‍ය, ආරක්ෂාව සහ අධ්‍යාපනය වැනි අදාළ අංශ හරහා මානසික සෞඛ්‍ය සහ මනෝ සමාජීය සහයෝගය සම්බන්ධීකරණය කිරීම)
- අන්‍යෝන්‍ය ඉගෙනීම සහ සංවර්ධනය සඳහා අවස්ථා සොයන අතරම, හවුල්කාර සංවිධානවල නියෝගය, දැක්ම සහ ස්වාධීනත්වයට ගරු කිරීම වාදගත්වේ.
- මානුෂීය උත්සාහයන් දේශීය ජනගහනයේ කාලයත් සමඟ ක්‍රමයෙන් වෙනස් වන අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්විය යුතු අතර පළාත් පාලන සහ ජාතික ආණ්ඩු වල ප්‍රතිචාර සලකා බැලිය යුතුය.
- පෞද්ගලික අංශයේ මානුෂීය ක්‍රියාමාර්ග බිම් මට්ටමේ අවශ්‍යතා සමග සමපාත වන පරිදි අනුවර්තනය කළ හැකි සහ නම්‍යශීලී විය යුතුය.
- ඵලදායී සම්පත් බලමුලු ගැන්වීමට පහසුකම් සැලසීම සඳහා පෞද්ගලික අංශයට ජාතික සහ දේශීය සන්නිවේදන මාර්ග සමග දිගුකාලීන හවුල්කාරිත්වයන් ඇති කර ගත හැකිය.

"මානුෂීය ආධාර සඳහා පෞද්ගලික අංශයේ සහභාගීත්වය, ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම සහ සූදානම වැඩිදියුණු කිරීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළ හැකිය. ඵලදායී සහයෝගිතාවයෙන් අවදානම් අවම කිරීම සඳහා පෞද්ගලික අංශයේ සම්පත් සහ විශේෂඥතාව උපයෝගී කර ගත හැකි අතර අනාගත අර්බුදවලට ඔරොත්තු දීමට සහ යථා තත්ත්වයට පත් වීමට ප්‍රජාවන්ගේ ධාරිතාව ශක්තිමත් කළ හැකිය"

.................................................................................

Source: Banerjee, T., & Gillespie, P. (2019). Private Sector Engagement in Disaster Risk Reduction and Resilience Building: A Review of Global Practices. International Journal of Disaster Risk Reduction, 39, 101245

එකඟතාවය

# 04

බලපෑමට ලක් වූ පුද්ගලයින්ට තම අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට සහ ඔවුන්ට බලපාන ක්‍රියාමාර්ග සහ තීරණ වලට ක්‍රියාකාරීව සහභාගී වීමට හැකියාව ලබා දීමෙන් ඔවුන් බලගැන්වීමෙන් ඔවුන් සහන ක්‍රියාවලියට සම්පූර්ණයෙන්ම ඒකාබද්ධ කර ඇති බව සහතික කිරීම.

## මානුෂීය ආධාර පිළිබඳ ගුණාත්මක නිර්ණායකය

### මානුෂීය ප්‍රතිචාරය පදනම් වන්නේ සහභාගීත්වය සහ පසුවිපරම මතය

**4.1**

**විනිවිද පෙනෙන සන්නිවේදනය :**

බලපෑමට ලක් වූ ප්‍රජාවන් සමග පැහැදිලි, විනිවිද පෙනෙන සහ සංස්කෘතික වශයෙන් සංවේදී සන්නිවේදනයක් සංවිධාන විසින් සහතික කළ යුතු අතර, ඔවුන්ගේ අයිතිවාසිකම් සහ ආධාර වැඩසටහන් පිළිබඳ කාලෝචිත තොරතුරු ලබා දිය යුතුය. සංස්කෘතික සංවේදීතාවන් සලකා බලා පහසුවෙන් අවදානමට ලක්විය හැකි පුද්ගලයින්ගේ ආරක්ෂාව සහතික කරමින් වගකීමෙන් යුතුව සන්නිවේදනය කිරීමට කාර්ය මණ්ඩලය පුහුණු කළ යුතුය.

**4.2**

**සංස්කෘතික වශයෙන් සංවේදී සහ ප්‍රවේශ විය හැකි සන්නිවේදනය**

යම් කණ්ඩායමක හෝ ප්‍රදේශයක බොහෝ සාමාජිකයින් සන්නිවේදනය සහ අන්තර්ක්‍රියා සඳහා භාවිතා කිරීමට කැමති සහ සන්නිවේදන ආකෘතීන් කෙරෙහි අවධානයෙන් සිටීම වැදගත්වේ. සංස්කෘතික හා ආගමික සංවේදීතාවන්ට ගරු කරමින් පැහැදිලි බව සහතික කිරීම සඳහා සන්නිවේදන ක්‍රම සකස් කළ යුතුය. ඇතුළත් කිරීම සහතික කිරීම සඳහා පහසුවෙන් අවදානමට ලක්විය හැකි, කොන්කිරීමට ලක් වූ සහ ආබාධිත කණ්ඩායම් සඳහා විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුය. සියලු පුද්ගලයින්ට, සාධාරණව හා සමානව සැලකීම (ඇතුළත් කිරීම) සහතික කිරීම සඳහා පහසුවෙන් අවදානමට ලක්විය හැකි, සමාජයේ කොන්කිරීමට ලක්වූ සහ ආබාධිත කණ්ඩායම් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුය.

**4.3**

**අර්ථවත් සහභාගීත්වයක් සහතික කිරීම**

අර්බුදකාරී බලපෑම්වලට ලක් වූ පුද්ගලයින්ට බලපාන තීරණ සහ ක්‍රියාවන් සඳහා අර්ථවත් සහභාගීත්වයක් ලබා දීම සඳහා සුසංයෝගී සංවිධානාත්මක ප්‍රවේශයක් වර්ධනය කළ යුතුය. වැඩසටහනේ සෑම අදියරකදීම ඔවුන් සම්බන්ධ කර ගැනීම සහ ඔවුන් කැමති සම්බන්ධතා ක්‍රම සමග ඔවුන්ගේ සහභාගීත්වය පෙළ ගැස්විය යුතුය.

**4.4**

**දේශපාලනික වශයෙන් සංවේදී සහ ගැටුම්කාරී තත්ත්වයන් ප්‍රවේශමෙන් සහ ආරක්ෂිතව මෙහෙයවීම**

දේශපාලනික වශයෙන් සංවේදී හෝ ගැටුම්කාරී අවස්ථාවන්හිදී, සැබෑ තත්වය පිළිබඳ නිවැරදි ව දැනුවත්භාවය ලබා ගැනීම සඳහා බලපෑමට ලක් වූ පුද්ගලයින්, පළාත් පාලන බලධාරීන්, පෞද්ගලික ආයතන, ප්‍රජා නායකයින් සහ ක්‍රියාකාරී දේශපාලන කණ්ඩායම් සමග වහාම සාකච්ඡා කිරීම ඉතා වැදගත්ය. ධනාත්මක සහ ගෞරවනීය සබඳතා ඇති කර ගැනීම සහ ඔවුන්ගේ නිශ්චිත සැලකිල්ල සහ රුචිකත්වයන් ග්‍රහණය කර ගැනීමට සහ ඒවාට විසඳුම් සෙවීමට විවෘත සන්නිවේදන සංස්කෘතියක් ප්‍රවර්ධනය කළ යුතුය.

## 4.5 පසුවිපරම සහ ආරක්ෂිත වාර්තාකරණයට පහසුකම් සැලසීම

අර්බුදකාරී බලපෑම්වලට ලක් වූ පුද්ගලයින්ගෙන් ඔවුන්ට ලැබෙන මානුෂීය ආධාරවල ගුණාත්මකභාවය සහ ඵලදායීතාවය පිළිබඳව පසුවිපරම් ලබාගැනීම දිරිමත් කිරීම සහ වඩාත් ඵලදායී කිරීම කළ යුතුය. පසු විපරම හා සම්බන්ධ කරුණු එක්රැස් කිරීමේ දී ස්ත්‍රී පුරුෂ භාවය, වයස සහ විවිධත්වය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන්න. ඵලදායී, ආරක්ෂිත, ප්‍රවේශ විය හැකි සහ කිසිදු පාර්ශවයක් හෝ කණ්ඩායමක් බැහැර නොකර, සියලුම පුද්ගලයින් ඇතුළත් කරගනිමින් සන්නිවේදන මාර්ග සංවර්ධනය කිරීම, සහ තොරතුරු සැකසීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දීම වැදගත්වේ. අප්‍රසන්න හෝ හානිකර ප්‍රතිවිපාකවලින් පුද්ගලයන් ආරක්ෂා කිරීම සඳහා රහසිගත පසුවිපරම් කිරීමේ යාන්ත්‍රණයන්ට ප්‍රමුඛත්වය දිය යුතුයි.

## ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහ නඩත්තු කිරීමට අවශ්‍ය ප්‍රායෝගික අංශ සහ අවශ්‍යතා සලකා බැලීම:

- විශ්වාසය ගොඩනැගීමට, සහභාගීත්වය වැඩි දියුණු කිරීමට සහ ව්‍යාපෘතියක සමස්ත බලපෑම උපරිම කිරීමට පෞද්ගලික සංවිධාන නිවැරදි, කාලෝචිත, තේරුම් ගත හැකි සහ ප්‍රවේශ විය හැකි තොරතුරු බෙදා ගත යුතුය.
- මානුෂීය ව්‍යාපෘතියේ සෑම අදියරකදීම අර්බුදයෙන් පීඩාවට පත් ප්‍රජාවන්ගේ සහ පුද්ගලයින්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය සහ සහභාගීත්වය ඇතිව, නියෝජනය ඇතුළත් බව සහතික කිරීම.
- ඇතැම් සමාජ කණ්ඩායම්වලට තමන් බෙදා ගැනීමට කැමති තොරතුරු පෞද්ගලිකව සාකච්ඡා කර තීරණය කිරීමට කාලය අවශ්‍ය විය හැකි බව හඳුනාගෙන, ඵලදායී, ආරක්ෂිත, ප්‍රවේශ විය හැකි සහ කිසිදු පාර්ශවයක් හෝ කණ්ඩායමක් බැහැර නොකර, සියලුම පුද්ගලයින් ඇතුළත් කර ගනිමින් සන්නිවේදනයකට වඩාත් ඵලදායී කිරීම කළ යුතුය.
- අර්බුදයෙන් පීඩාවට පත් පුද්ගලයින්ට හෝ ප්‍රජාවන්ට පෞද්ගලික සමාගම් සමඟ ආපදා සහන සාකච්ඡාවලට සහභාගී වීමට ඒ හා සම්බන්ධ සම්පූර්ණ දැනුම ලබා දෙමින් ඔවුන්ගේ අවසරය සහ ප්‍රකාශිත පැහැදිලි කැමැත්ත ලබාගෙන ඇති බව සහතික කිරීම.
- ප්‍රතිචාරය ආරම්භයේදීම බලපෑමට ලක් වූ පුද්ගලයින් සහ ප්‍රාදේශීය ආයතන සමඟ ක්ෂණිකව සහ ඵලදායී ලෙස සන්නිවේදනය කර, පවතින දැනුම උපයෝගී කර ගැනීමට සහ ධනාත්මක සබඳතා වර්ධනය කිරීමට උත්සාහ කළ යුතුයි. විශේෂයෙන් ගැටුම් කලාපවල දේශපාලනික අවශ්‍යතා සඳහා සිදු කරනු ලැබේ යැයි සැලකිය හැකි ක්‍රියාමාර්ග වළක්වා ගැනීමට සුපරීක්ෂාකාරී විය යුතුයි.
- බලපෑමට ලක් වූ පුද්ගලයින් විවේචනාත්මක පසු විපරම් ලබා දීමෙන් ඍණාත්මක ප්‍රතිවිපාක ඇති විය හැකි බවට බිය විය හැකි බැවින් ඔවුන්ට රහසිගත සහ ආරක්ෂිත පසු විපරම් යාන්ත්‍රණයක් ලබා ගත හැකි බව සහතික කළ යුතුයි .
- පෞද්ගලික සංවිධාන තම උපාය මාර්ග සහ වැඩසටහන් ප්‍රවර්ධනය වැඩිදියුණු කිරීමට සහ යාවත්කාලීන කිරීමට අර්බුදවලින් පීඩාවට පත් පුද්ගලයින්ගෙන් ලැබෙන පසුවිපරම් ඇතුළත් කළ යුතුය.
- එවැනි දත්ත හා සම්බන්ධ කණ්ඩායම් හෝ පුද්ගලයින් නිරාවරණය වීම හෝ අපහසුතාවයට පත් වීම වැළැක්වීම සඳහා තොරතුරු රාජකාරි හෝ වගකීම් ඉටු කිරීමට අවශ්‍ය අයට පමණක් හෙළිදරව් කරන පදනම මත අනෙකුත් පාර්ශවකරුවන් සමඟ තොරතුරු බෙදා ගත යුතුයි.
- බාහිර මුද්‍රිත සන්නිවේදනයන්, විශේෂයෙන් රූප සහ කථා ඇතුළත් ඒවා, තුළින් පුද්ගලයින් පහසුවෙන් අවදානමට ලක්විය හැකි අතර, ඒවා පුද්ගලයින්ට, ජනයාට හෝ ප්‍රජාවන්ට නොදැනුවත්වම හානි කිරීමට හෝ හඳුනා ගැනීමට නොහැකි බව සහතික විය යුතුය.
- මානුෂීය ප්‍රතිචාරයේදී කඩිනම් සන්නිවේදනය අත්‍යවශ්‍ය වේ, මන්ද එය ආපදා වින්දිතයින්ට ඔරොත්තු දීමේ හැකියාව සහ හැකි ඉක්මනින් යථා තත්ත්වයට පත්වීම සඳහා අවශ්‍ය තොරතුරු සපයයි.

“මානුෂීය උත්සාහයන් බලපෑමට ලක් වූ ප්‍රජාවන් බලගැන්වීමට ප්‍රමුඛත්වය දිය යුතු අතර, ඔවුන්ට ක්‍රියාවලිය තුළ හඬක් ඇති බවත් තීරණ ගැනීමේදී ක්‍රියාකාරීව සම්බන්ධ වීමට හැකිබවත් සහතික කළ යුතුය. මෙම ප්‍රවේශය දේශීය ධාරිතාවය ශක්තිමත් කරනවා පමණක් නොව මානුෂීය වැඩසටහන්වල හිමිකාරිත්වය සහ තිරසාරභාවය ද සහතික කරයි. පෞද්ගලික අංශයට, එහි අද්විතීය සම්පත් සහ හැකියාවන් සමඟින්, සියලූ දෙනාගේ සහභාගීත්වය පහසු කිරීම සහ ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන මුලපිරීම් සඳහා සහාය වීම සඳහා සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කළ හැකිය”.

..........................................................................

Source: IFRC (International Federation of Red Cross and Red Crescent Societies). (2018). World Disasters Report: Leaving No One Behind. Geneva, Switzerland: IFRC

එකගතාවය

# 05

පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ප්‍රතිචාරාත්මක යාන්ත්‍රණ ස්ථාපිත කිරීම සහ ජනතාවට ගැටළු සහ පැමිණිලි වාර්තා කිරීමට අවදානම් අවම කරන හෝ ඉවත් කරන පරිසරයක් ස්ථාපිත කර ඒවා නිසි ලෙස විසඳා ඇති බව සහතික කිරීම

## ගුණාත්මක නිර්ණායකය

පැමිණිලි පිළිගෙන, ආමන්ත්‍රණය කර ඒවා විසඳීමට හැකි ක්‍රියාවලියක් පවතී.

## අවශ්‍යතා සහ මාර්ගෝපදේශ

### 5.1 පැමිණිලි පද්ධති ආයතනික සංස්කෘතියට ඒකාබද්ධ කිරීම :

ආපදාවන්ට ප්‍රතිචාර දැක්වීමේදී ශක්තිමත් පැමිණිලි වාර්තා කිරීමේ සහ පසුවිපරම් ලබාදීමේ පද්ධතියක් යනු ආයතනික සංස්කෘතියේ අනිවාර්ය අංගයක් විය යුතුය. පෞද්ගලික අංශය, ආයතනයේ පැමිණිලි කළමනාකරණ පද්ධති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යසනයකට මුහුණ දී ඇති ප්‍රජාවන් ක්‍රියාකාරීව සම්බන්ධ කර ගත යුතුය.

### 5.2 පැමිණිලි ආමන්ත්‍රණය කිරීමේ සහ විසඳීමේ, ක්‍රියාවලිය පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම:

ස්වාභාවික විපත් හෝ මානුෂීය අර්බුදයකින් බලපෑම්වලට ලක් වූ ප්‍රජාවන්ට, සංවිධානය විසින් අනුගමනය කරනු ලබන පැමිණිලි ආමන්ත්‍රණය කිරීමේ සහ විසඳීමේ, ක්‍රියාවලිය පිළිබඳව දැනුවත් කළ යුතුය. අපේක්ෂාවන් කළමනාකරණය කිරීම සඳහා සහ පසු විපරම් ලබාගැනීමේ යාන්ත්‍රණය හරහා සියලු ගැටලු විසඳා ගත හැකිය යන වැරදි මතය වළක්වා ගැනීම සඳහා අධීක්ෂණ ක්‍රියාවලියට ආමන්ත්‍රණය කළ හැකි ගැටළු වල විෂය පථය පැහැදිලිව නිර්වචනය කිරීම වැදගත් වේ.

### 5.3 ආරක්ෂිත සහ ප්‍රවේශ විය හැකි වාර්තාකරණ ක්‍රම :

ආරක්ෂිත සහ ප්‍රවේශ විය හැකි වාර්තාකරණ ක්‍රම පිළිගත් හොඳම භාවිතයන්ට අනුකූලව, ප්‍රජා සාමාජිකයින්ට ඔවුන්ගේ පසු විපරම් ලබා දීමට සහ ගැටළු හෝ පැමිණිලි වාර්තා කිරීමට ආරක්ෂිත, ප්‍රවේශ විය හැකි සහ සුදුසු යාන්ත්‍රණ ස්ථාපිත කළ යුතුය. සියලුම ප්‍රජා සාමාජිකයින්ට, කාර්ය මණ්ඩලයට සහ හවුල්කාර සංවිධානවලට මෙම ක්‍රම හරහා පැමිණිලි වාර්තා කිරීමට අවස්ථාව ඇති බව සහතික කිරීම වැදගත් වේ. පසු විපරම් ලබාදීමට සහ පැමිණිලි ඉදිරිපත් කිරීම පහසු කිරීම සඳහා යෝජනා පෙට්ටි සහ අන්තර්ක්‍රියා සඳහා පහසුකම් සපයන ඩිජිටල් සේවාවක් ක්‍රියාත්මක කිරීම සලකා බැලිය හැකිය.

## 5.4 සාධාරණ හා කාලෝචිත පැමිණිලි කළමනාකරණය:

පැමිණිලිකරුගේ ආරක්ෂාව සහතික කරමින්, සියලූම පැමිණිලි කාලෝචිත, සාධාරණ සහ සුදුසු ආකාරයකින් භාරගෙන, කළමනාකරණය කළ යුතුය. වින්දිතයා කේන්ද්‍ර කරගත් ප්‍රවේශයන් භාවිතා කරමින් පැමිණිලි හැසිරවීමේදී, විශේෂයෙන් ලිංගික සූරාකෑම හෝ අපයෝජනය වැනි සංවේදී ගැටළු ආමන්ත්‍රණය කිරීමේදී රහස්‍යභාවය පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ.

## 5.5 සංවේදී චෝදනා ආමන්ත්‍රණය කිරීම සහ විසඳීම පිළිබඳ පුහුණුව :

මානුෂීය සහන සේවකයින් මගින් සිදුවිය හැකි ලිංගික සූරාකෑම, අපයෝජනය හෝ හිරිහැර කිරීම පිළිබඳ චෝදනා විමර්ශනය කිරීම සඳහා පෞද්ගලික අංශයේ කාර්ය මණ්ඩලය පුහුණු කළ යුතුය. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් අනුමත කරන ලදල කාර්ය මණ්ඩල චර්යාධර්ම පද්ධතියක් (ආයතනයක් තුළ අපේක්ෂිත සේවක හැසිරීම් සහ සදාචාරාත්මක ප්‍රමිතීන් ගෙනහැර දක්වන නීති රීති සහ මාර්ගෝපදේශ මාලාව) සෑම සංවිධානයකටම තිබිය යුතු අතර, එය බලපෑමට ලක් වූ පුද්ගලයින්/ ප්‍රජාවන් වෙත පැහැදිලිව සහ කඩිනමින් සන්නිවේදනය කළ යුතුය.

## 5.6 අපරාධ ක්‍රියාකාරකම් හෝ නීතිමය උල්ලංඝනයන් සඳහා වන ප්‍රොටෝකෝල :

අපරාධ ක්‍රියාකාරකම් හෝ ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් සුදුසු බලධාරීන් සම්බන්ධ කර ගන්නේ කෙසේද යන්න පිළිබඳව කාර්ය මණ්ඩලය දැනුවත් විය යුතුය. එවැනි නඩු පිළිගත් යහපත් පිළිවෙත්වලට අනුකූලව කළමනාකරණය කිරීම, විමර්ශනය කිරීම, ආමන්ත්‍රණය කිරීම සඳහා සුදුසු පරිදි යොමු කළ යුතුය.

## 5.7 පසුවිපරම් එකතු කරගැනීම සහ විශ්ලේෂණය කිරීම සඳහා ක්‍රියා කරන ක්‍රමය:

එකතු කරන ලද පසුවිපරම් විශ්ලේෂණය කරන්නේ කෙසේද, පසුවිපරම් පිළිගන්නේ සහ වලංගු කරන්නේ කෙසේද සහ පසුවිපරම් හුවමාරු කරගන්නේ කෙසේද යන්න පිළිබඳ පැහැදිලි න්‍යාය පත්‍රයක් සමඟ පසුවිපරම් සහ පැමිණිලි එකතු කිරීම සඳහා ක්‍රියා කරන ක්‍රමයක් සකස් කර ගැනීම වඩාත් සුදුසුය. ලැබුණු අදහස් සහ පැමිණිලි මත පදනම්ව ක්‍රියාත්මක කරන ලද වෙනස්කම් සම්බන්ධයෙන් නිතිපතා ප්‍රජාවට යාවත්කාලීන තොරතුරු සැපයීමට හෝ ලබා ගැනීමට සුදුසු යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට පියවර ගත යුතුය.

## ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහ නඩත්තු කිරීමට අවශ්‍ය ප්‍රායෝගික අංශ සහ අවශ්‍යතා සලකා බැලීම:

- පැමිණිලි හැසිරවීමේ ක්‍රියාවලින් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම පිළිබඳව ආපදාවලින් පීඩාවට පත් ප්‍රජාවන් සහ පුද්ගලයින් සමඟ සාකච්ඡා කිරීමට අවස්ථා ලබා දීම .
- පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී රහස්‍යභාවය සහතික කිරීම සඳහා ශක්තිමත් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සහ පැමිණිලි යාන්ත්‍රණය සැලසුම් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී පහසුවෙන් අවදානමට ලක්විය හැකි සහ සමාජය විසින් කොන් කරන ලද පුද්ගලයින්/ ප්‍රජාවන් සම්බන්ධ කර ගැනීම.
- පෞද්ගලික සංවිධානවල ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් අනුමත කරන ලද සහ ප්‍රසිද්ධියේ ප්‍රකාශයට පත් කරන ලද ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් අනුමත කරන ලද කාර්ය මණ්ඩල චර්යාධර්ම පද්ධතියක් (ආයතනයක් තුළ අපේක්ෂිත සේවක හැසිරීම් සහ සදාචාරාත්මක ප්‍රමිතීන් ගෙනහැර දක්වන නීති රීති සහ මාර්ගෝපදේශ මාලාව) පවත්වා ගැනීම.
- හවුල්කරුවන් සමඟ වැඩ කරන විට, ඔවුන් එකිනෙකාට එරෙහිව කරන පැමිණිලි ඇතුළුව, පැමිණිලි ඉදිරිපත් කිරීම සහ හැසිරවීම සඳහා වන ක්‍රියා පටිපාටි සම්බන්ධයෙන් සංවිධාන එකඟ විය යුතුය.

- පසුවිපරම් ලබා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳව ව්‍යාජ උපකල්පන ඇතිවීම වැළැක්වීමට සහ පැමිණිලි ක්‍රියාවලිය පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීමට, අපේක්ෂා කළ යුතු දේ සහ එය අපේක්ෂා කළ යුතු කාලයපිළිබඳ පැහැදිලි අවබෝධයක් තිබිය යුතුය.
- විවිධ ආකාරයේ පැමිණිලි ඵලදායී ලෙස හැසිරවීමට උපාය මාර්ග සකස්කිරීම.
- අදාළ පාර්ශ්වකරුවන් සමඟ පසු විපරම තුළින් සහ පැමිණිලි විශ්ලේෂණය කිරීම, වලංගු කිරීම සහ නිසි ලෙස බෙදා ගැනීම සඳහා වන ක්‍රියා පටිපාටි හඳුනා ගැනීම.
- පැමිණිල්ලේ හෝ දුක්ගැනවිලිවල ස්වභාවය අනුව, විසඳීමට පහසුකම් සැලසීම සඳහා පෞද්ගලික අංශයේ සංවිධාන, පවතින දේශීය යාන්ත්‍රණයන්, සමථ මණ්ඩලය, ප්‍රාදේශීය පොලිසිය හෝ ආගමික නායකයින් භාවිතා කිරීම සලකා බැලිය යුතුය.

"මානුෂීය ආධාර ලබා දීම හා සම්බන්ධ සේවයේ නියැලී සිටින පෞද්ගලික අංශයේ සේවකයන් වගවීමෙ සහ විශ්වාසය සහතික කිරීම සඳහා පැමිණිලි හැසිරවීම සඳහා ශක්තිමත් සහ ආරක්ෂිත යාන්ත්‍රණ ක්‍රියාත්මක කළ යුතුය. මෙම යාන්ත්‍රණ ප්‍රතිචාරාත්මක, රහස්‍යභාවය රකින සහ විශේෂයෙන් පහසුවෙන් අවදානමට ලක්විය හැකි පුද්ගලයන් / ජනතාව ඇතුළුව සැමට, ප්‍රවේශ විය යුතු ආකාරයෙන් තිබිය යුතුය. ඵලදායී පැමිණිලි හැසිරවීමේ පද්ධති විනිවිදභාවය වැඩි දියුණු කරනවා පමණක් නොව, ආධාර වැඩසටහන් අඛණ්ඩව වැඩිදියුණු කිරීමට ද දායක වේ".

.....................................................................

Source: ALNAP (Active Learning Network for Accountability and Performance). (2018). The State of the Humanitarian System 2018. London: ALNAP/ODI.

එකඟතාවය

# 06

අර්බුදවලින් පීඩාවට පත් ජනතාවට ආධාර ලබා දීම හා සම්බන්ධ ප්‍රයත්නයන් ඵලදායී ලෙස සම්බන්ධීකරණයන් අන්‍යෝන්‍ය සහයෝගිතාවයෙන් යුක්ත බව සහතික කළ යුතුය.

## මානුෂීය ආධාර පිළිබඳ ගුණාත්මක නිර්ණායකය

**මානුෂීය ප්‍රතිචාර මනා සම්බන්ධීකරණ සහ අන්‍යෝන්‍ය සහයෝගිත්වයෙන් යුතුවේ**

### 6.1 සම්බන්ධීකරණය සහ අනුපූරකත්වය ප්‍රවර්ධනය කිරීම :

ආවරණය උපරිම කිරීම සහ ඵලදායී සම්පත් උපායමාර්ගිකව හඳුනා ගැනීම, අත්පත් කර ගැනීම සහ භාවිතා කිරීම සඳහා ජාතික, පළාත් පාලන ආයතන සහ අනෙකුත් සංවිධාන සමඟ මානුෂීය ප්‍රතිචාර ලබා දීම හා සම්බන්ධ ප්‍රයත්නයන් ඵලදායී ලෙස සම්බන්ධීකරණය කර අන්‍යෝන්‍ය සහයෝගිතාවයෙන් ක්‍රියාකිරීමට පෞද්ගලික අංශය උත්සාහ කළ යුතුය.

### 6.2 තනතුරුවලට පවරා ඇති නිශ්චිත කාර්යයන්, නිර්වචනය කිරීම සහ උත්සාහයන් පෙළගැස්වීම:

සියළුම පාර්ශවකරුවන්ගේ භූමිකාවන් සහ හැකියාවන් සංවිධාන නිර්වචනය කළ යුතු අතර, ඔවුන්ගේ උත්සාහයන් අනෙකුත් අදාළ ජාතික සහ ප්‍රාදේශීය පාර්ශවකරුවන්ගේ මුලපිරීම් ඇතුළුව දේශීය වශයෙන් මෙහෙයවනු ලබන, ප්‍රජා පාදක ක්‍රියාමාර්ග සමඟ සමපාත වන බව සහතික කළ යුතුය.

### 6.3 අර්බුදකාරී අවස්ථාවන්හිදී ස්වාධීනත්වය ක්‍රියාත්මක කිරීම :

අර්බුදකාරී හෝ ගැටුම්කාරී තත්ත්වයකදී, බලධාරීන් පාර්ශවයන් ලෙස සම්බන්ධ වන විට පෞද්ගලික අංශයට අයත් මානුෂීය සංවිධාන එම බලධාරීන්ගේ ස්වාධීනත්වය සම්බන්ධයෙන් විනිශ්චය ක්‍රියාත්මක කළ යුතුය. තීරණ ගැනීමේදී ඕනෑම දේශපාලන පසුබිමක් හෝ බලපෑමක් පිළිබඳව සැලකිල්ලට ගැනීමට වඩා බලපෑමට ලක් වූ පුද්ගලයන් හෝ ජනතාවගේ අවශ්‍යතා සහ ලැදිකම් වලට ප්‍රමුඛත්වය දිය යුතුය.

### 6.4 හමුදා මෙහෙයුම්වල යෙදෙන විට සිවිල් වැසියන් සහ හමුදා අරමුණු අතර ඇති වෙනස හඳුනා ගැනීම:

අපක්ෂපාතීත්වය සහ විශ්වාසනීයත්වය ආරක්ෂා කිරීම සඳහා පෞද්ගලික අංශයේ මානුෂීය සංවිධාන සිවිල් වැසියන් සහ හමුදා අරමුණු අතර ඇති වෙනස පවත්වාගත යුතුය. මෙම වෙනස පවත්වාගැනීම සංවිධානයේ අරමුණු සහ බලපෑමට ලක් වූ පුද්ගලයන් හෝ ජනතාව වෙත අඛණ්ඩව, නොනැවතී සහ කිසිදු බාධාවකින් තොරව ප්‍රවේශ වීම ආරක්ෂා කිරීම සඳහා ඉතා වැදගත් වේ.

## 6.5

**ගුණාත්මකභාවය සහ වගවීමේ ප්‍රමිතීන්ට සහාය වීම :**

ජනතාව සහ ප්‍රජාවන් සමග ඔවුන්ගේ කාර්යයේ සෑම අදියරකදීම ගුණාත්මකභාවය සහ වගවීම සඳහා කැපවීම් යෙදීමේදී හවුල්කරුවන්ට සහාය විය යුතුය. මානුෂීය ආධාරවල ඉහළ ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා හවුල්කරුවන් සමග සබඳතාවල ගුණාත්මකභාවය සහ ඵලදායීතාවය නිතිපතා තක්සේරු කිරීම සහ අවශ්‍ය විටෙක නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම ද වැදගත් වේ.

## 6.6

**ප්‍රජාව අවබෝධ කර ගැනීම :**

ආපදාවෙන් පීඩාවට පත් ප්‍රජාවේ සමාජ-ආර්ථික පසුබිම, ඒවායේ බලපෑම් සහ සංස්කෘතික පසුබිම පිළිබඳව සම්පූර්ණයෙන්ම තේරුම් ගැනීමට ඔවුන් අත්විඳ ඇති බලපෑම් පහසුවෙන් අවදානමට ලක්විය හැකි තත්ත්වය සහ සංස්කෘතික පසුබිම පිළිබඳව පූර්ණ අවබෝධයක් ලබා ගැනීම සඳහා ප්‍රජා මට්ටමින් මානුෂීය ප්‍රතිචාරය අවබෝධ කර ගැනීම මූලික දෙයක් ලෙස සැලකිය යුතුය. පෞද්ගලික අංශය ප්‍රජාව සමග සෘජුව සම්බන්ධ වීමට පෙර ද්විතීයික දත්ත රැස් කිරීම සහ විශ්ලේෂණය සඳහා ප්‍රමුඛත්වය දිය යුතුය. මෙම තොරතුරු මගින් ප්‍රජාවේ අවශ්‍යතා, ශක්තීන් සහ සංවේදීතාවන් පිළිබඳ වටිනා අවබෝධයක් ලබා දෙන අතර, මැදිහත්වීම් අදාළ, සහ කිසිදු හානියක් හෝ තුවාලයක් සිදු කිරීමෙන් වැළකී සිටීම සහ අන් අයගේ යහපැවැත්මට ප්‍රමුඛත්වය දීම (Do no harm), යන මූලධර්මවලට අනුකූල බව සහතික කරනු ලැබේ.

## ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහ නඩත්තු කිරීමට අවශ්‍ය ප්‍රායෝගික අංශ සහ අවශ්‍යතා සලකා බැලීම:

- මානුෂීය ක්‍රියාමාර්ගවලට සම්බන්ධ විවිධ පාර්ශවකරුවන් භූමිකාවන්, වගකීම්, හැකියාවන් සහ අවශ්‍යතා පිළිබඳව පෞද්ගලික සංවිධාන දැනුවත් විය යුතුය.
- මානුෂීය ප්‍රතිචාරය ජාතික සහ පළාත් පාලන ආයතන සහ අනෙකුත් මානුෂීය සංවිධානවල ප්‍රතිචාරයට අනුපූරක වන බව සහතික කිරීම.
- පුනරාවර්තනය වීම වැළැක්වීමට සහ මානුෂීය යහපත් පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම සඳහා සුදුසු සන්නිවේදන මාර්ග හරහා හවුල්කරුවන්, සම්බන්ධීකරණ කණ්ඩායම් සහ අනෙකුත් අදාළ පාර්ශවකරුවන් සමග අවශ්‍ය තොරතුරු බෙදා ගැනීමට වග බලා ගැනීම.
- බලධාරීන් ගැටුමේ පාර්ශවකරුවෙකු වන විට, මානුෂීය සංවිධාන බලධාරීන්ගේ ස්වාධීනත්වය සම්බන්ධයෙන් ඔවුන්ගේ විනිශ්චය භාවිතා කළ යුතු අතර, බලපෑමට ලක් වූ ජනතාවගේ අවශ්‍යතා ඔවුන්ගේ තීරණ ගැනීමේ කේන්ද්‍රයේ තබා ගත යුතුය.
- වෙන් වූ ආකාරයකින් තනි කොටස් කෙරෙහි අවධානය යොමු කිරීම වෙනුවට, සමස්තයක් වශයෙන් ජනතාවගේ අවශ්‍යතා සපුරාලීම (උදා: මානසික සෞඛ්‍යය සහ මනෝ සමාජීය සහයෝගය පිළිබඳ සම්බන්ධීකරණය සෞඛ්‍ය, ආරක්ෂාව, අධ්‍යාපනය වැනි අදාළ සියලුම අංශ හරහා විශේෂඥයින් සමග තාක්ෂණික වැඩ කණ්ඩායමක් හරහා සිදු කළ යුතුය).
- හවුල්කාර සංවිධානවල වරම, දැක්ම සහ ස්වාධීනත්වයට ගරු කළ යුතු අතර, අන්‍යෝන්‍ය ඉගෙනීම සහ සංවර්ධනය සඳහා අවස්ථා ගවේෂණය කළ යුතුය.
- මානුෂීය උත්සාහයන් ප්‍රාදේශීය ජනගහනයේ වෙනස්වන අවශ්‍යතාවලට සංවේදී විය යුතු අතර සෑම විටම ප්‍රාදේශීය සහ ජාතික රජයේ ප්‍රතිචාර සලකා බැලිය යුතුය.
- පෞද්ගලික අංශයේ මානුෂීය ක්‍රියාමාර්ග නම්‍යශීලී විය යුතු අතර, එය හුදෙක් න්‍යායාත්මක හෝ වියුක්ත අදහස් වලට වඩා සැබෑ ලෝක අවශ්‍යතා මත රඳා පවතී.
- නිශ්චිත ඉලක්ක හෝ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විවිධ සම්පත් (කාර්යක්ෂමව සහ උපායමාර්ගිකව රැස් කිරීම සහ භාවිතා කිරීම, ඒවා ප්‍රශස්ත ලෙස සහ තිරසාර ලෙස භාවිතා කරන බව සහතික කිරීම සඳහා පෞද්ගලික අංශයට ජාතික සහ දේශීය සන්නිවේදන නාලිකා සමග ස්ථිර හවුල්කාරිත්වයන් ඇති කර ගත හැකිය.

"ඵලදායී මානුෂීය ආධාර ලබාදීම සඳහා, උත්සාහයන් අනුකරණය වීම වැළැක්වීමට සහ සහන ක්‍රියාකාරකම්වල ප්‍රවේශය සහ බලපෑම උපරිම කිරීමට, පෞද්ගලික අංශයේ ක්‍රියාකාරීන් ඇතුළු සියලුම පාර්ශවකරුවන් අතර ශක්තිමත් සම්බන්ධීකරණයක් අවශ්‍ය වේ. පෞද්ගලික අංශයට, සම්පාදනයේ සිට බෙදා හැරීම දක්වා එහි මෙහෙයුම් පුරාවට සම්පත් සහ අදාළ තොරතුරු කාර්යක්ෂමව සැලසුම් කිරීමට, ක්‍රියාත්මක කිරීමට සහ පාලනය කිරීමට ඇති හැකියාවන් සහ සම්පත් සමඟින්, බලපෑමට ලක් වූ ජනතාවට සහ ප්‍රජාවන්ට කාලෝචිත හා කාර්යක්ෂම ආධාර සැපයීම සහතික කරන සම්බන්ධීකරණ ප්‍රතිචාර සඳහා සහාය වීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළ හැකිය".

.........................................................................

Source: UNDP (2016). Engaging the Private Sector in Post-Disaster Recovery: Guidelines for Decision Makers. New York: UNDP.

එකගතාවය

# 07

ප්‍රතිපෝෂණය, අත්දැකීම් සහ පසුවිපරම් සිතුවිල්ලක් හෝ සලකා බැලීම තුළින් අඛණ්ඩව වැඩසටහන් වැඩිදියුණු කිරීම සහතික කිරීම

## ගුණාත්මක නිර්ණායකය

අත්දැකීම් සහ පරාවර්තනය බැරෑරුම් ලෙස සලකා බැලීම තුළින් මානුෂීය ක්‍රියාකාරිත්වය දියුණු වේ.

## අවශ්‍යතා සහ මාර්ගෝපදේශ

### 7.1 අතීත අත්දැකීම් උපයෝගී කර ගැනීම

වැඩසටහන් සැලසුම් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී උගත් පාඩම් සහ පෙර අත්දැකීම් උපයෝගී කරගනිමින් කාර්යක්ෂමතාව වැඩි දියුණු කළ යුතුය. මෙම ප්‍රවේශය අතීත වැරදි වළක්වා ගැනීමට සහ වැඩසටහන් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට උපකාරී වේ.

### 7.2 දැනුම හෝ කුසලතා ලබා ගැනීම, නව ක්‍රම හඳුන්වා දීමෙන් වෙනසක් ඇතිකිරීම සහ නව භාවිතයක් හෝ අරමුණක් සඳහා වෙනසක් ඇතිකිරීම

පසුවිපරම, පැමිණිලි, අධීක්ෂණය සහ ඇගයීම පදනම් කර ගනිමින් අඛණ්ඩව දැනුම හෝ කුසලතා ලබා ගැනීම සහ නව ක්‍රම හඳුන්වා දීමෙන් වෙනසක් ඇතිකිරීමට උත්සහ දැරිය යුතුය. ලබාගත් දැනුම හෝ අවබෝධය භාවිතා කරමින් සංවිධානයේ සමස්ත කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා වැඩසටහන් තුළ සැලසුම්ගත වෙනස් කිරීම් හෝ යාවත්කාලීන කිරීම් සිදු කිරීම.

### 7.3 දත්ත විශ්ලේෂණය සහ අර්ථ නිරූපණය මත පදනම් ව තීරණ ගැනීම

තීරණ ගැනීමේ ක්‍රියාවලීන් පිළිබඳව දැනුවත් කිරීම සඳහා අධීක්ෂණය, පසුවිපරම, පැමිණිලි සහ දැනුම හෝ කුසලතා ලබා ගැනීම වැනි දෙවල් තුළින් ලබා ගන්නා ලද දත්ත භාවිතා කළ යුතු ය. වැඩසටහන් වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා මෙම දත්ත මත පදනම්ව වැඩසටහන් සහ ආයතනික භාවිතයන් නිතිපතා යාවත්කාලීන කිරීම ඉතා සුදුසුයි.

### 7.4 බලපෑමට ලක් වූ ප්‍රජාවන් බලගැන්වීම

හදිසි ආපදා තත්ත්වයකින් සෘජුවම බලපෑමට ලක් වූ පුද්ගලයින් බොහෝ විට ඔවුන්ගේ වර්තමාන තත්වයන් සහ ඉලක්ක මත පදනම්ව අවශ්‍ය වෙනස්කම් හෝ වැඩිදියුණු කිරීම් තක්සේරු කිරීම හෝ තීරණය කිරීමට හැකි ස්ථාවරයක සිටින බැවින් ඔවුන්ගේ අදහස්, යෝජනා සහ අත්දැකීම් ඇතුළත් කිරීම ඉතා වැදගත්වේ. මෙම කරුණු ප්‍රවේශමෙන් සලකා බලා අවධානම් අවම කර ගනිමින් සහ කාර්යක්ෂමතාව උපරිම කර ගනිමින් ක්‍රියාත්මක කිරීම සඳහා මග පෙන්වීම සහ සම්පත් ලබා දීමෙන් නව ක්‍රම හඳුන්වා දී වෙනසක් ඇතිකිරීමට හා අනුවර්තනයන්ට සහාය වීමට හැකිය.

## 7.5 අනෙකුත් ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම

සහයෝගීතාවයෙන් වැඩ කිරීමෙන් හා ඒකාබද්ධ උත්සාහයන් ගැනීම තුළින් නව්‍ය විසඳුම් හෝ පුළුල් අවබෝධයකට මඟ පාදන, නව හෝ වෙනස් ක්‍රම ලබා ගැනීමට සහ සීමිත සම්පත් භාවිතය උපරිම කිරීමට රජයේ ආයතන ඇතුළු අනෙකුත් ආයතන සමඟ සමීපව කටයුතු කිරීම අවශ්‍ය වේ.

## 7.6 අතීත අත්දැකීම් වලින් ලබාගත් දැනුම අනාගත ප්‍රතිඵල වැඩිදියුණු කිරීම සඳහා යෙදවීම

අතීත අත්දැකීමකින් ව්‍යාපෘතියකින් හෝ සිදුවීමකින් ලබාගත් දැනුම භාවිතාකරමින් වැඩිදියුණු කිරීම සඳහා හඳුනා ගන්නා ලද ක්ෂේත්‍ර ක්‍රමානුකූලව ආමන්ත්‍රණය කරන බවට සහතික විය යුතුය. මෙය ඵලදායී යැයි සැලකීමට නම්, වෙනස්කම් මැනිය හැකි අන්දමින් වත්මන් හෝ අනාගත හැසිරීම් මෙන්ම ප්‍රතිඵලවල ද පැහැදිලිව පෙනෙන, ඔප්පු කළ හැකි හෝ පෙන්විය හැකි වෙනස්කම් වලට තුඩු දිය යුතුය.

## 7.7 දැනුම කළමනාකරණය කිරීමේ පිළිවෙත් ක්‍රියාත්මක කිරීම

අඛණ්ඩ ඉගෙනීම වැඩිදියුණු කිරීමට නම් ආයතනයක සියලුම අංශ පොදු ඉලක්කයක් සපුරා ගැනීම සඳහා ඵලදායී ලෙස එකට වැඩ කළයුතුය. මෙයට ගුණාත්මකභාවය සහ වගවීම වැඩි දියුණු කිරීම සඳහා දැනුම රැස් කිරීම, සංවර්ධනය කිරීම, බෙදා ගැනීම, ගබඩා කිරීම සහ ඵලදායී ලෙස භාවිතා කිරීම ඇතුළත් වේ.

## 7.8 සවිස්තරාත්මක උප කාණ්ඩවලට බෙදා වෙන් කරන ලද දත්ත රැස් කිරීම සහ භාවිතා කිරීම

තීරණ ගැනීම සඳහා භාවිතා කරන බව සහතික කරමින් සහ දත්ත සපයන්නන් මත බර අවම කරමින් ජනතාවගේ සහ ප්‍රජාවන්ගේ විවිධත්වය පිළිබිඹු කරන සවිස්තරාත්මක උප කාණ්ඩවලට බෙදා වෙන් කරන ලද දත්ත රැස් කළයුතුය. විශ්ලේෂණය නොකරන හෝ භාවිතා නොකරන දත්ත රැස් කිරීමෙන් වැලකීසිටීම වැදගත් කරුණයක්ය.

## 7.9 දිගුකාලීනව පදනම් වූ අදහස් යෝජනා සහ අත්දැකීම් (පසුවිපරම)

පෞද්ගලික අංශය විසින් ක්ෂණික හෝ කෙටි කාලීන ප්‍රතිචාර අවධීන්ගෙන් ඔබ්බට ගොස් ප්‍රජාවන් සමඟ තිරසාර සම්බන්ධතාවයක් සහතික කරන දිගුකාලීනව පදනම් වූ අදහස් යෝජනා සහ අත්දැකීම් යාන්ත්‍රණයක් ස්ථාපිත කර පවත්වාගෙන යා යුතුය. මෙම යාන්ත්‍රණය මඟින් මතුවන ගැටළු හඳුනා ගැනීමට, මැදිහත්වීම්වල බලපෑම තක්සේරු කිරීමට සහ මානුෂීය ආධාර පරිණාමය වන අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වන බව සහතික කිරීමට උපකාරී වනු ඇත. අඛණ්ඩ දියුණුවක් ඇති කිරීම මගින් එය මානුෂීය ප්‍රතිචාරයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කරනවා පමණක් නොව ප්‍රජාව සහ පෞද්ගලික අංශයේ ඔරොත්තු දීමේ හැකියාවද ශක්තිමත් කරයි.

## ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහ නඩත්තු කිරීමට අවශ්‍ය ප්‍රායෝගික අංශ සහ අවශ්‍යතා සලකා බැලීම:

- විශ්ලේෂණය සඳහා අත්‍යවශ්‍ය නොවන දත්ත රැස් කිරීමෙන් වැළකී සිටීම.
- බලපෑමට ලක් වූ ජනතාවගේ/ප්‍රජාවන්ගේ විවිධත්වය පිළිබිඹු කරන ආකාරයෙන් සවිස්තරාත්මක උප කාණ්ඩවලට බෙදා වෙන් කරන ලද දත්තරැස් කර තීරණ ගැනීමේ ක්‍රියාවලියේ යෙදී සිටින්නන් දැනුවත් කිරීමට එය භාවිතා කිරීම.
- වැඩසටහන් නිර්මාණයේදී අතීත අත්දැකීම් වලින් ඉගෙන ගත් පාඩම් අදාළ කරගැනීම.
- බලපෑමට ලක් වූ පුද්ගලයින් තම ජීවිතයේ වෙනස්කම් පිළිබඳ හොඳම විනිශ්චයකරුවන් වන බැවින් ඔවුන්ගේ අදහස්, යෝජනා සහ අත්දැකීම් (feedback) සැලකිල්ලට ගැනීම.

- අර්බුදවලින් බලපෑමට ලක් වූ පුද්ගලයින් නව හෝ වෙනස් තත්වයන් හෝ පරිසරයන්ට ගැලපෙන පරිදි හැඩගැසෙන විට අඛණ්ඩව නව අදහස් හෝ ක්‍රම නැවත නැවතත් හඳුන්වා දීම සිදු කරන බව හඳුනා ගනිමින් වෘත්තීය සහාය ලබා දීම සහ බලපෑමට ලක් වූ පුද්ගලයින් වඩාත් ක්‍රමානුකූලව සම්බන්ධ කර ගැනීම.
- අනෙකුත් ආයතන, රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන සහ අධ්‍යයන ආයතන සමඟ කණ්ඩායම් වශයෙන් එකට වැඩ කර ඉගෙන ගැනීම තුළින් ගැටළු විසඳීමට හෝ කාර්යයන් සම්පූර්ණ කිරීමට ක්‍රියාකාරී සහභාගීත්වය සහ දැනුම බෙදා ගැනීම තුළින් නව දෘෂ්ටිකෝණ සහ අදහස් ලබා ගැනීම.
- වත්මන් හෝ අනාගත ප්‍රතිචාරවල පහසුවෙන් දැකිය හැකි දැනිය හැකි හෝ මැනිය හැකි සැබෑ සංයුක්ත සහ කැපී පෙනෙන දියුණුවක් ඇතිකිරීමට අත්දැකීමකින් හෝ සිදුවීමකින් ලබාගත් වැදගත්ම අවබෝධය සහ දැනුම ක්‍රමානුකූලව ඇතුළත් කිරීම.
- විනිවිදභාවය සහ අඛණ්ඩ වැඩිදියුණු කිරීම සහතික කිරීම සඳහා අභ්‍යන්තරව සහ කොටස්කරුවන් සමඟ අවබෝධයන් අදහස්, යෝජනා සහ අත්දැකීම් නව අදහස් හෝ ක්‍රම බෙදා ගැනීම.

"පෞද්ගලික අංශයේ අය ඇතුළුව අවශ්‍යතා ඇති පුද්ගලයින්ට මානුෂීය ආධාර සැපයීම සඳහා එක්ව කටයුතු කරන සංවිධාන, ආයතන සහ අන්තර් ආයතන වැඩසටහන් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා අනුවර්තන ඉගෙනීම සහ අඛණ්ඩ වැඩිදියුණු කිරීම සඳහා ප්‍රමුඛත්වය දිය යුතුය. මෙයට අතීත ක්‍රියාවන් මෙනෙහි කිරීම, ඒවායේ බලපෑම තක්සේරු කිරීම සහ අනාගත මුලපිරීම් සඳහා එම අවබෝධයන් යෙදවීම ඇතුළත් වේ. ක්‍රමානුකූල ඉගෙනීම සහ පරාවර්තනය සඳහා යාන්ත්‍රණයන් ඇතුළත් කිරීමෙන්, පෞද්ගලික අංශයේ දායකත්වයන් බලපෑමට ලක් වූ ප්‍රජාවන්ගේ පරිණාමනය වන අවශ්‍යතාවලට වඩාත් බලපෑම් සහගත සහ ප්‍රතිචාරාත්මක විය හැකිය".

..........................................................................

Source: Bennett, C., & Foley, M. (2016). Time to Let Go: Remaking Humanitarian Action for the Modern Era. London: Overseas Development Institute (ODI)

එකඟතාවය

# 08

තම අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහ සේවා ස්ථානයට ධනාත්මක දායකත්වයක් ලබා දීමට ඵලදායී ලෙස මඟ පෙන්වනු ලබන ගෞරවනීය සහ හොඳින් කළමනාකරණය කරන ලද කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයින් විසින් මානුෂීය ආධාර ලබා දීම

## මානුෂීය ආධාර පිළිබඳ ගුණාත්මක නිර්ණායකය

මානුෂීය ආධාර ලබා දෙන සේවයේ යෙදී සිටින මානුෂීය කාර්ය මණ්ඩලය දක්ෂ, ගෞරවනීය සහ හොඳින් කළමනාකරණය කරන ලද අයගෙන් සමන්විතය

**8.1** **ඵලදායී මානව සම්පත් කළමනාකරණයක් ස්ථාපිත කිරීම :**

පිළිගත් යහපත් පිළිවෙත්වලට අනුකූලවල සාධාරණ, වෙනස්කම් කිරීමෙන් තොර, සහ විනිවිද පෙනෙන ආකාරයකින් මානව සම්පත් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා පෞද්ගලික අංශයේ සංවිධාන ආයතනයේ සියලුම අංශ පොදු ඉලක්කයක් සපුරා ගැනීම සඳහා ඵලදායී ලෙස එකට වැඩකරන ආයතනික ප්‍රවේශයක් වර්ධනය කළ යුතුය.

**8.2** **නිපුණතා සහ වෘත්තීය වර්ධනය :**

තමන්ගෙන් අපේක්ෂා කරන යුතුකම් සහ වගකීම් කාර්යක්ෂමව හා ඵලදායී ආකාරයකින් සාර්ථකව ඉටු කිරීම සඳහා කාර්ය මණ්ඩලය අවශ්‍ය පුද්ගලික, තාක්ෂණික සහ කළමනාකරණ නිපුණතා වර්ධනය කර භාවිතා කළ යුතුය. අත්දැකීම්, පුහුණුව, මග පෙන්වීම හෝ පුහුණු කිරීම තුළින් නිපුණතා වැඩි දියුණු කළ හැකි බැවින්, වර්ධනය හා සංවර්ධනය සඳහා ඇති අවස්ථා පිළිබඳව කාර්ය මණ්ඩලය දැනුවත් බව සංවිධාන සහතික කළ යුතුය.

**8.3** **ඇතුළත් කරගැනීම සහ ගෞරවය ප්‍රවර්ධනය කිරීම :**

සමාජ ආර්ථික තත්ත්වය වැනි විවිධ සාධක හේතුවෙන් සමාජ බැහැර කිරීම් වෙනස්කම් කිරීම් සහ සම්පත් සහ අවස්ථාවන්ට සීමිත ප්‍රවේශයක් අත්විඳින අයව අපකීර්තියට පත් කිරීම සහ වෙනස් කොට සැලකීමේ අවස්ථාවන් වළක්වා ගැනීම සඳහා සංවිධාන විසින් තම කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයින් අතර දැනුවත්භාවය වැඩි කළ යුතුය.

**8.4** **ආරක්ෂිත සහ සියල්ල ඇතුළත් සේවා පරිසරයක් සහතික කිරීම:**

සේවකයින්ගේ පසුබිම හෝ අනන්‍යතාවය නොසලකා, සෑම කෙනෙකුටම වටිනාකමක් ගෞරවයක් සහ බලගැන්වීමක් දැනෙන සහ වෙනස්කම් කිරීම, හිරිහැර කිරීම, හෝ ප්‍රචණ්ඩත්වයට බියෙන් තොරව නිදහසේ තම අදහස් ප්‍රකාශ කළ හැකි සේවා ස්ථාන පරිසරයක් පවත්වා ගැනීම සඳහා සියලුම කාර්ය මණ්ඩලයේ සහ ස්වේච්ඡා සේවකයින්ගේ ආරක්ෂාව, යහපැවැත්ම සහ ගෞරවය ආරක්ෂා කිරීමට පියවර ගත යුතුය. අතිශය දුක්ඛිත සිදුවීම් අත්විඳ ඇති හෝ දැක ඇති සේවකයින්ට ක්ෂණික මානසික ප්‍රථමාධාර ලබා දීම ඉතා සුදුසුය.

## 8.5 නම්‍යශීලී කාර්ය සාධන ඇගයීම් ක්‍රියාවලීන් :

කෙටි කාලීන කොන්ත්‍රාත්තු මත සේවය කරන කාර්ය මණ්ඩලයට මෙන්ම විවෘත කොන්ත්‍රාත්තු ඇති අයටද පහසුකම් සැලසීමට කාර්ය සාධන ඇගයීම් ක්‍රියාවලීන් නම්‍යශීලී විය යුතු අතර එමඟින් සේවකයෙකුගේ ශක්තීන් වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර සහ සමස්ත දායකත්වය කෙරෙහි අවධානය යොමු කරන ව්‍යුහගත කාලානුරූපී ඇගයීම් ඇතුළත් වන බව සහතික කකළ යුතුය.

## 8.6 වාර්තා කිරිම සඳහා ආරක්ෂිත මාර්ග ස්ථාපිත කිරීම:

කනස්සල්ලට හේතු වන හෝ ආරක්ෂක අනතුරක් හෝ වරදක් වැනි ගැටලු මතු කරන දෙයක් පිළිබඳව සුදුසු අධිකාරියකට හෝ සංවිධානයකට විධිමත් ලෙස දැනුම් දීමට කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන්ට සහ ස්වේච්ඡා සේවකයින්ට ආරක්ෂිත, රහස්‍ය සහ ප්‍රවේශ විය හැකි ක්‍රම ඇති බව සහතික කළ යුතුය. ආරක්ෂිත සහ විශ්වාසදායක වාර්තාකරණ පරිසරයක් පවත්වා ගැනීම සඳහා වාර්තා කරන අයට සුදුසු ආරක්ෂාවන් ක්‍රියාත්මක කිරීම වැදගත් වේ.

# ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහ නඩත්තු කිරීමට අවශ්‍ය ප්‍රායෝගික අංශ සහ අවශ්‍යතා සලකා බැලීම:

- මානුෂීය කටයුතුවල නියැලී සිටින පෞද්ගලික අංශයේ කාර්ය මණ්ඩලය, සංවිධානයේ නිශ්චිත කාර්යයන්, හෝ ඉලක්ක ඉටු කිරීම සඳහා එයට ලබා දී ඇති නිල අවසරය, වටිනාකම්, එකඟ වූ අරමුණු සහ කාර්ය සාධන ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියා කළ යුතුය.
- සංවිධානයේ නිශ්චිත කාර්යයන් හෝ ඉලක්ක ඉටු කිරීම සඳහා එයට ලබා දී ඇති නිල අවසරය වටිනාකම් සහ කාර්ය සාධන ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කළ යුතු අතර; එයට සියලුම ස්ත්‍රී පුරුෂ භාවයන් සඳහා සමාන නියෝජනයක් සහ අවස්ථා ලබාදීම සහ කිසිදු පාර්ශවයක් හෝ කණ්ඩායමක් බැහැර නොකර සියලූම පුද්ගලයින් ඇතුළත් කිරීම සඳහා ඇති කැපවීමද ඇතුළත් වේ.
- කාර්ය මණ්ඩලය තම කාර්යභාරය ඉටු කිරීම සඳහා අවශ්‍ය පුද්ගලික, තාක්ෂණික සහ කළමනාකරණ නිපුණතා වර්ධනය කර භාවිතා කළ යුතු අතර මෙය කිරීමට සංවිධානයට සහාය විය හැකි ආකාරය ඔවුන් තේරුම් ගත යුතුය.
- සූරාකෑම, අපයෝජනය, හිරිහැර කිරීම, වෙනස් කොට සැලකීම හෝ සම්පත් අනිසි ලෙස භාවිතා කිරීම තහනම් කරන කාර්ය මණ්ඩල චර්යාධර්ම පද්ධතියක් කාර්ය මණ්ඩලයේ සියලූම සාමාජිකයන් සහ ස්වේච්ඡා සේවකයින් තේරුම් ගෙන ඒවා පිළිපැදීම සහතික කළයුතුය.
- පෞද්ගලික අංශය කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයින් තුළ ස්ත්‍රී පුරුෂ සමතුලිතතාවය පවත්වා ගැනීමට මෙන්ම ආබාධ සහිත පුද්ගලයින්ට ද විවෘත, කිසිදු පාර්ශවයක් හෝ කණ්ඩායමක් බැහැර නොකර සියලූම පුද්ගලයින් ඇතුළත් කරගන්නා, සහ ප්‍රවේශ විය හැකි සේවා පරිසරයක් පවත්වා ගැනීමට කැපවිය යුතුය.
- කාර්ය මණ්ඩලයේ සියලූම සාමාජිකයින්ට සහ ස්වේච්ඡා සේවකයින්ට අවශ්‍ය නිපුණතා ඇති බවත් පුහුණුව මග පෙන්වීම සහ පුහුණු කිරීම තුළින් ඔවුන් තම රැකියා කාර්යයන් ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා සහාය වන බවත් සහතික කර ගතයුතුය.
- ආයතනික ප්‍රතිපත්තීන් අඩංගු අත්පොත් වෙත පහසුවෙන් ප්‍රවේශ වීම මගින් කාර්ය මණ්ඩලයේ සියලූම සාමාජිකයින්ට ආයතනික ප්‍රතිපත්ති සහ ඒවා පිළිපැදීමෙන් ඇතිවන ප්‍රතිවිපාක පිළිබඳව කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමට පහසුකම් සැපයීම වැදගත්ය.
- අවශ්‍ය විටෙක ක්ෂණික මනෝවිද්‍යාත්මක ප්‍රථමාධාර ලබා දෙමින් කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයින් ආරක්ෂිත සහ කිසිදු පාර්ශවයක් හෝ කණ්ඩායමක් බැහැර නොකර සියලූම පුද්ගලයින් ඇතුළත් කරගන්නා පරිසරයක සිටින බව සහතික කරගත යුතුය.

"ඵලදායී මානුෂීය ආධාර රඳා පවතින්නේ සපයනු ලබන සම්පත් මත පමණක් නොව එය ලබා දෙන කාර්ය මණ්ඩලයේ ගුණාත්මකභාවය සහ වෘත්තීයභාවය මත ය. පෞද්ගලික අංශය අර්ථවත් ලෙස දායක වීමට නම්, කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් ලෙස පුහුණු කර, කළමනාකරණය, ගෞරවය, නිපුණතාවය සහ වගවීම පිළිබඳ මූලධර්ම ආරක්ෂා කරන බව සහතික කළ යුතුය. මෙම ප්‍රවේශය සපයනු ලබන ආධාරවල විශ්වාසය සහ ඵලදායීතාවය වැඩි දියුණු වන අතර ආධාර ලබන අයගේ ගෞරවයට ද සහාය වේ".

.....................................................

Source: Stoddard, A., Harmer, A., & DiDomenico, V. (2009). Providing Aid in Insecure Environments: 2009 Update. Humanitarian Policy Group Report 34. London: Overseas Development Institute (ODI)

එකගතාවය

# 09

## සම්පත් ඵලදායී ලෙස සහ සදාචාරාත්මකව ඉහළම වගකීමකින් යුතුව කළමනාකරණය කරන බවට සහතික වීම

### ගුණාත්මක නිර්ණායකය

සම්පත් සදාචාරාත්මකව සහ වගකීමෙන් යුතුව කළමනාකරණය කර භාවිතා කරනු ලැබේ.

### අවශ්‍යතා සහ මාර්ගෝපදේශ

**9.1** **සංයුක්ත ආයතනික ප්‍රවේශයක් :**

පෞද්ගලික සංවිධාන විසින් සම්පත් කාර්යක්ෂමව සහ සදාචාරාත්මකව කළමනාකරණය කිරීම සඳහා සුසංයෝගී ප්‍රවේශයක් අනුගමනය කළ යුතු අතර, ප්‍රතිචාරයේ සෑම අදියරකදීම ප්‍රමාණවත් ධාරිතාවක් සහ නාස්තිය අවම කිරීම සහතික කළ යුතුය. දේශීය හා ස්වාභාවික සම්පත් භාවිතා කරන විට, ඒවායින් ඇතිවිය හැකි පාරිසරික බලපෑම සලකා බැලීම ඉතා වැදගත්වේ.

**9.2** **වගකිවයුතු මූල්‍ය කළමනාකරණය**

පෞද්ගලික අංශයේ සංවිධාන පිළිගත් යහපත් පිළිවෙත්වලට අනුකූලව මූල්‍ය සම්පත් වගකීමෙන් යුතුව කළමනාකරණය කළ යුතුය. සැලසුම් කළ වියදම් ප්‍රමාණයන් සමග සැබෑ වියදම් සංසන්දනය කරමින් සියලුම වියදම් නිතිපතා නිරීක්ෂණය කර ලේඛනගත කළයුතු අතර, අවභාවිතය හෝ වංචාව වැනි පැහැදිලි හෝ සැක සහිත ගැටළුවක් ඇති විට එය අනාවරණය කර ගැනීම සඳහා මූල්‍ය වාර්තා ගනුදෙනු සහ අදාළ ක්‍රියාකාරකම් පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියක් වන විමර්ශන විගණන ආරම්භ කළ යුතුය. අරමුදල් රැස් කිරීම, අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සම්පත් හඳුනා ගැනීම, සුරක්ෂිත කිරීම සහ ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සහ අරමුදල් වෙන් කිරීම සදාචාරාත්මකව සිදුවන බවත් සංවිධානයේ කැපවීම් සහ වටිනාකම් අවදානමට ලක් නොවන බවත් සහතික කිරීම කළයුතුය.

**9.3** **අරමුදල් හෝ සම්පත් දායකයන්ට මෙන්ම, සංවිධාන හෝ රජයන් බලපෑමට ලක් වූ, ප්‍රජාව වෙනුවෙන් ඇති වගවීම**

සපයන ලද සම්පත් හොඳ විනිශ්චයකින් යුතුව තිරසාර ලෙස භාවිතා කරන බව පෞද්ගලික අංශය වග බලා ගත යුතු ය. එමෙන්ම, මානුෂීය සංවිධාන අරමුදල් හෝ සම්පත් සපයන පුද්ගලයින්, සංවිධාන, හෝ රජයන්, වෙත මෙන්ම බලපෑමට ලක් වූ පුද්ගලයින් හෝ ප්‍රජාවන් ට ද වගකිව යුතුය. සංවිධාන තම අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා සම්පත් බුද්ධිමත්ව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස භාවිතා කර ඇති බව පෙන්නුම් කළ යුතුය.

## 9.4

**අවදානම් කළමනාකරණය සහ විනිවිදභාවය :**

වංචා, දූෂණ සහ අනිසි භාවිතයේ අවදානම් කළමනාකරණය කිරීම, කොටස්කරුවන් සමග විනිවිදභාවය පවත්වා ගැනීම සහ ස්ථානීය අධීක්ෂණ යාන්ත්‍රණ ස්ථාපිත කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

## ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහ නඩත්තු කිරීමට අවශ්‍ය ප්‍රායෝගික අංශ සහ අවශ්‍යතා සලකා බැලීම:

- උග්‍ර අර්බුදවලදී ආධාර වැඩසටහන් සදාචාරාත්මකව සහ වගකීමෙන් යුතුව කළමනාකරණය කිරීම සඳහා පෞද්ගලික අංශය පළපුරුදු මානුෂීය කාර්ය මණ්ඩලයක් යෙදවිය යුතුය.
- මූල්‍ය ඉලක්ක සපුරා ගැනීම සහ සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම සහතික කිරීම සඳහා සැලසුම් කළ අයවැයකට සාපේක්ෂව සැබෑ ආදායම සහ වියදම් නිතිපතා නිරීක්ෂණය කිරීම සහ විශ්ලේෂණය කිරීම සහ අයවැයට අදාළ වියදම් වාර්තා කිරීම.
- සම්පත් භාවිතය ඵලදායී ආකාරයෙන් භාවිතා කිරීම සහ මානුෂීය ප්‍රතිචාරය වැඩිදියුණු කිරීම සඳහා සියලුම පාර්ශ්වකරුවන් සමඟ ඵලදායී සහයෝගීතාවයක් සහ සම්බන්ධීකරණයක් සහතික කිරීම.
- ප්‍රමිතීන්ට අනුකූල වීම සහ නාස්තිය අවම කිරීම සමඟ කාලෝචිත ප්‍රතිචාර දැක්වීමේ අවශ්‍යතාවය තුලනය කරමින්, ඵලදායී ලෙස අවදානම් අවම කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ආරම්භ කිරීම.
- සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම, විනිවිද පෙනෙන සහ වගකිවයුතු භාවිතය සහතික කිරීම.
- වංචාවක්, දූෂණයක්, සම්පත් අනිසි ලෙස භාවිතා කිරීමක් හෝ බැඳියාවන් අතර ගැටුමක් වාර්තා කිරීමට කාර්ය මණ්ඩලය දිරිමත් කරන ආයතනික සංස්කෘතියක් ඇති කිරීම.
- දූෂණ සිදුවීමේ අවදානම් අවම කිරීම සඳහා ස්ථානීය අධීක්ෂණ යාන්ත්‍රණයන් මගින් ප්‍රජා සාමාජිකයින් සමඟ ඵලදායී හා ගෞරවනීය ලෙස සම්බන්ධ වීම.
- කාර්ය මණ්ඩලය අතර අනවශ්‍ය බැඳීමක් ඇති කළ හැකි ආකාරයෙන් තෑගි භුවමාරුකර ගැනීම සම්බන්ධයෙන් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ එවැනි තෑගි ආචාරශීලී ලෙස ප්‍රතික්ෂේප කිරීම දිරිමත් කිරීම.
- ආයතනය තුළ මූල්‍ය කළමනාකරණය සහ වාර්තාකරණයේ හොඳම පිළිවෙත් ක්‍රියාත්මක කිරීම සහතික කිරීම.
- ඕනෑම ගැටුම්කාරී තත්වයක් පිලිබඳව, විවෘතව සාකච්ඡා කිරීමට සහ හෙළි කිරීමට කාර්ය මණ්ඩලයට බලය ඇති බව හැඟෙන පරිසරයක් නිර්මාණය කිරීම.
- විමර්ශන විගණන ආයතනික ක්‍රියාවලීන් සමඟ ඒකාබද්ධ කර අවශ්‍ය පරිදි ඒවා සිදු කිරීම.

"මානුෂීය ආධාර ලබා දීම හා සම්බන්ධ ක්‍රියාවලදී සුවිශේෂී හැකියාවන් සහ සම්පත් සඳහා දායකත්වය ලබා දෙන පෞද්ගලික අංශයේ ක්‍රියාකාරීන් සඳහාල සම්පත් සදාචාරාත්මක හා වගකිවයුතු ලෙස කළමනාකරණය කිරීම ඉතා වැදගත් වේ. මෙයට, මූල්‍ය වගවීම පමණක් නොව ගනු ලබන සියලු ක්‍රියාමාර්ග බලපෑමට ලක් වූ ජනතාවගේ හෝ ප්‍රජාවගේ  ගෞරවයට හා අයිතිවාසිකම්වලට ගරු කරන බව  මානුෂීය මූලධර්මවලට අනුකූලව ක්‍රියාත්මක වන බව සහ තිරසාර සංවර්ධන ප්‍රතිඵල ප්‍රවර්ධනය කරන බව, සහතික කිරීම ද ඇතුළත් වේ".

……………………………………………………………………………….

Source: Higgins, J., & N. Simon (2018). Ethics in Humanitarian Action: A Study of the Humanitarian Accountability Partnership (HAP). Humanitarian Accountability Partnership International

# ව්‍යසන අවස්ථාවකදී ප්‍රයෝජනවත් වන ස්ථාන සහ සහාය සංවිධානවල සම්බන්ධතා

අර්බුදයකින් පීඩාවට පත් ප්‍රජාවකට මානුෂීය ආධාර සැපයීමේදී පෞද්ගලික අංශයේ සංවිධානයක් මග පෙන්වීම හෝ සහාය ලබා ගැනීමට උත්සාහ කරන්නේ නම්, මඟ පෙන්වීම සහ සහාය සඳහා පහත සඳහන් ජාතික හෝ පළාත් පාලන ආයතන සම්බන්ධ කර ගත හැකිය.



**ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය**

ජාතික ආපදා ප්‍රතිචාර දැක්වීමේ උත්සාහයන් සම්බන්ධීකරණය කරන අතර මානුෂීය ක්‍රියාමාර්ග පිළිබඳ මාර්ගෝපදේශ සපයනු ලබයි.

Emergency Operations Centre (EOC)

Tel• _(94) 112 136 222

_(94) 112 670 002

_(94) 112 136 136

_(94) 773 957 900

_(94) 763 117 117

**ඇමතුම් මධ්‍යස්ථානය,**

117 (දිනකට පැය 24 පුරාම, සතියේ දින 7 පුරාම ක්‍රියාත්මක වේ)

**දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක**
දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල පිහිටා ඇත

**ආපදා කළමනාකරණ අමාත්‍යාංශය**
ජාතික ආපදා කළමනාකරණ ප්‍රතිපත්ති අධීක්ෂණය කරන අතර විවිධ ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කරයි

**පළාත් පාලන ආයතන (උදා: පළාත් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරීන්**
බලපෑමට ලක් වූ ප්‍රජාවන්ට විශේෂිත වූ දේශීය සහාය සහ මග පෙන්වීම ලබා දීම.

**ශ්‍රී ලංකා පොලිසිය**
නීතිය හා සාමය පවත්වා ගැනීමට සහාය වීම මෙන්ම ප්‍රතිචාර දැක්වීම

**ආගමික සහ ප්‍රජා නායකයින්**
ප්‍රජාවන් සම්බන්ධ කර ගැනීමේදී සහ දේශීය අවශ්‍යතා හඳුනා ගැනීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි

**අදාල ප්‍රදේශයේ ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධාන**
(උදා: රතු කුරුස සංවිධානය, Save the Children, Janathakshan ආදිය)
විශේෂිත සහාය සහ සහන ක්‍රියාකාරකම් සැපයීම

# මූලික මානුෂීය ප්‍රමිතිය පිළිබඳ පිරික්සුම් ලැයිස්තුව

පහත වගුවේ දක්වා ඇති මූලික මානුෂීය සම්මත පිරික්සුම් ලැයිස්තුව ඔවුන්ගේ ව්‍යාපෘති සැලසුම් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී මානුෂීය ක්‍රියාමාර්ගවල නියැලී සිටින පෞද්ගලික අංශයේ සංවිධානවලට මඟ පෙන්වීම සඳහා නිර්මාණය කර ඇති අතර, කාර්යක්ෂමතාව, කිසිදු පාර්ශවයක් හෝ කණ්ඩායමක් බැහැර නොකර, සියලුම පුද්ගලයින් ඇතුළත් කර ගැනීම සහ කාර්යක්ෂමතාව වැනි ප්‍රධාන අංග ප්‍රමාණවත් ලෙස ආමන්ත්‍රණය කර ඇති බව සහතික කරයි. මෙම පිරික්සුම් ලැයිස්තුවේ ඇති ඕනෑම ප්‍රශ්නයකට දෙනු ලබන "නැත" යන පිළිතුර අවශ්‍යතාවයක් නොසලකා හැර ඇති බව පෙන්නුම් කරන අතර අනාගත මානුෂීය ක්‍රියාමාර්ග සැලසුම් කිරීමේදී සමාගම හෝ සංවිධානය මෙම හිඩැස් ආමන්ත්‍රණය කිරීම බැරෑරුම් ලෙස සලකා බැලිය යුතුය යන්න ආවරණය කරනු ලබයි.

| | ප්‍රශ්නය | ඔව් | නැත |
|---|---|---|---|
| 1 | ප්‍රජාවේ ක්ෂණික අවශ්‍යතා වන ආහාර, ඖෂධ, නවාතැන්, ඇඳුම් පැළඳුම් හෝ පෝෂණ සේවා වැනි දෙවල් පිළිබඳව තේරුම් ගැනීමට ඔබ ඔවුන් සමඟ සම්බන්ධ වුණාද ? | | |
| 2 | ඔබ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත මානුෂීය ක්‍රියාමාර්ගවලට අදාළ පණිවිඩ ප්‍රජාවට ගෙන ඒම සඳහා වඩාත් ඵලදායී සන්නිවේදන ක්‍රම හඳුනා ගැනීමට ඔබට හැකිවුනාද ? | | |
| 3 | අර්බුද හෝ ආපදා වලදී අවශ්‍යතා ඇති අයට ආධාර සැපයීමට හැකි විවිධ සංවිධාන ක්‍රම සහ මාර්ග පිළිබඳව අදාළ සහ ප්‍රමාණවත් දත්ත සහ තොරතුරු ඔබ විසින් රැස් කරනු ලැබුවාද ? | | |
| 4 | කාන්තාවන්, වැඩිහිටියන්, නව යොවුන් වියේ පසුවන පිරිමි ළමයින් සහ ගැහැණු ළමයින්, ආබාධ සහිත පුද්ගලයින් යන අය හෝ ප්‍රජාව තුළ සිටින අනෙකුත් කණ්ඩායම් වල නිශ්චිත අවශ්‍යතා තේරුම් ගැනීම සඳහා ඔබ ඔවුන් සියලු දෙනා සමඟ සාකච්ඡා කළාද ? | | |
| 5 | ඔබගේ අවශ්‍යතා තක්සේරුවේදී අදාළ වන මූලික මානුෂීය ප්‍රමිතීන් ඔබ සලකා බැලුවාද ? | | |
| 6 | ඔබ මානුෂීය සහන මෙහෙයුම් වලනිරතවීමේදී ආගමික නායකයින් ඇතුළු ප්‍රාදේශීය ප්‍රජා නායකයින් සම්බන්ධ කර ගත්තාද? | | |
| 7 | ඔබේ මානුෂීය ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේදී අදාළ වන මූලික මානුෂීය ප්‍රමිතීන් ඔබ සලකා බැලුවාද? | | |

| | | | |
|---|---|---|---|
| 8 | ඔබේ ව්‍යාපෘතියේ අරමුණු සහ ඉහළ මට්ටමේ අපේක්ෂාවන්, ප්‍රතිලාභීන් කවුරුන්ද යන්න සහ මානුෂීය ක්‍රියාමාර්ගයේදී ඔවුන් තෝරා ගැනීමේ නිර්ණායක පිළිබඳව ගෙනහැර දක්වන තොරතුරු ඔබ විසින් ප්‍රජාවට දැනුම් දෙනු ලැබුවාද ? | | |
| 9 | මානුෂීය ව්‍යාපෘතිය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා ඔබේ කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයින් ප්‍රමාණවත් ලෙස පුහුණු කර තිබේද? | | |
| 10 | ඔබ පළාත් පාලන බලධාරීන්ට ඔවුන්ගේ ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමට අදහස් කරන මානුෂීය ක්‍රියාමාර්ග පිළිබඳව දැනුම් දුන්නාද? | | |
| 11 | යෝජිත මානුෂීය ආධාර ව්‍යාපෘතිය සඳහා මානව සම්පත් මූල්‍ය සම්පත් සහ ද්‍රව්‍යමය සම්පත් ඔබ ප්‍රමාණවත් ලෙස වෙන් කළාද ? | | |
| 12 | පැමිණිලි සහ හදිසි ආපදා තත්ත්වයකින් සෘජුවම බලපෑමට ලක් වූ පුද්ගලයින්ගේ අදහස්, යෝජනා සහ අත්දැකීම් ලබා ගැනීම සඳහා පැහැදිලි යාන්ත්‍රණයක් ඔබ ස්ථාපිත කර තිබේද ? අර්බුදයෙන් පීඩාවට පත් පුද්ගලයින් පැමිණිලි ක්‍රියා පටිපාටිය පිළිබඳව ප්‍රමාණවත් ලෙස දැනුවත් කර තිබේද ? | | |
| 13 | මානුෂීය මෙහෙයුම් වලදී ඔබේ ක්‍රියාමාර්ගවලට අදාළ අභියෝග සහ සීමාවන් තේරුම් ගැනීමට සිතියම්කරණ අභ්‍යාසයක් (mapping exercise) පැවැත්වුවාද? | | |
| 14 | කාන්තාවන් පිරිමි ළමයින් ගැහැණු ළමයින් වැඩිහිටියන් ආබාධ සහිත පුද්ගලයින් ඇතුලුව ප්‍රජාවේ විවිධ අංශවලට අයත් පුද්ගලයන් ඔබේ මානුෂීය ක්‍රියාමාර්ගයේ සමානව සම්බන්ධ වන බවට ඔබ සහතික කළාද? | | |
| 15 | ඔබේ මානුෂීය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ අදියරේදී ඔබ මානුෂීය මූලධර්ම සහ මූලික මානුෂීය ප්‍රමිතීන්ට අනුකූල වූවාද? | | |
| 16 | ඔබේ මානුෂීය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේදී එහි ඇති වැඩිදියුණු කළ හැකි ක්ෂේත්‍ර සහ ධනාත්මක අංශ හඳුනා ගැනීමට ඔබ දත්ත රැස් කර විශ්ලේෂණය කළාද ? | | |
| 17 | ඔබගේ මානුෂීය ක්‍රියාමාර්ගය පිළිබඳව අර්බුදකාරී බලපෑම්වලින් පීඩාවට පත් ජනතාවගේ සමස්ත තෘප්තිය ඇතුළුව බලපෑම් සහ ප්‍රතිඵල තක්සේරු කිරීමට ඔබ දත්ත රැ ස් කළාද? | | |

## අර්ථකථන

- ඔබේ සංවිධානයේ මුළු ලකුණු සංඛ්‍යාව 8 සහ 9 අතර වේ නම් එයින් පෙන්නුම් කරන්නේ ඔබේ සංවිධානය මානුෂීය ආධාරවල මූලික මූලධර්මවලින් ආසන්න වශයෙන් 50% ක් පිළිපැද ඇත.
- ඔබේ සංවිධානයේ මුළු ලකුණු සංඛ්‍යාව 9 ට අඩු නම්, එයින් ඇඟවෙන්නේ ඔබේ සංවිධානයට මානුෂීය ආධාරවල ඉහළම ප්‍රමිතීන් වලින් සැලකිය යුතු සංඛ්‍යාවක් නොමැති බවයි.
- ඔබේ සංවිධානයේ මුළු ලකුණු සංඛ්‍යාව 8 ට අඩු නම්, එය ඔබේ සංවිධානය මානුෂීය ආධාරයේ මූලික මූලධර්ම කෙරෙහි බැරෑරුම් ලෙස සලකා බැලීමේ අවශ්‍යතාවය ඉස්මතු කරයි.

# ආශ්‍රිත ග්‍රන්ථ


- ALNAP (Active Learning Network for Accountability and Performance). (2018). The State of the Humanitarian System 2018. London: ALNAP/ODI. Available at: file:///C:/Users/lanka/Downloads/SOHS%20Online%20Book%201%20updated.pdf

- Asian Preparedness Partnership (2022). Private Sector Core Humanitarian Standards (CHS) Guide. Available at: file:///C:/Users/lanka/Downloads/Private-Sector-CHS-Guide-220831.pdf

- Banerjee, T., & Gillespie, P. (2019). Private sector engagement in disaster risk reduction and resilience building: A review of global practices. International Journal of Disaster Risk Reduction, 39, 101245. Available at: https://doi.org/10.1016/j.ijdrr.2019.101245

- Bennett, C., & Foley, M. (2016). Time to Let Go: Remaking Humanitarian Action for the Modern Era. London: Overseas Development Institute (ODI). Available at: https://media.odi.org/documents/10422.pdf

- IFRC (International Federation of Red Cross and Red Crescent Societies). (2018). World Disasters Report: Leaving No One Behind. Available at: https://www.ifrc.org/document/world-disasters-report-2018

- Inter-Agency Standing Committee (2023). Framework – Collective Accountability to Affected People (AAP). Geneva: IASC. Available at: https://interagencystandingcommittee.org/sites/default/files/2024-01/IASC_Collective%20AAP%20Framework.pdf.

- OCHA (United Nations Office for the Coordination of Humanitarian Affairs). (2017). OCHA-WEF Guiding Principles for Public-Private Collaboration for Humanitarian Action. New York: OCHA. Available at: https://interagencystandingcommittee.org/sites/default/files/migrated/2014-11/World%20Economic%20Forum%20-%20OCHA%20Guiding%20Principles%20for%20Public-Private%20Collaboration%20in%20Humanitarian%20Action.pdf?_gl=1%2A2p35pa%2A_ga%2ANDMwMDcwMjY2LjE3MzE1MDE3NjY.%2A_ga_E60ZNX2F68%2AMTczMTUwMTc2NS4xLjEuMTczMTUwMTg5OS42MC4wLjA.

- Sphere Association (2018). The Sphere Handbook: Humanitarian Charter and Minimum Standards in Humanitarian Response, fourth edition, Geneva, Switzerland, 2018. www.spherestandards.org/handbook

- Sphere. (2024). Core Humanitarian Standard on Quality and Accountability – 2024 Edition. Available at: file:///C:/Disaster%20Management%20with%20CCC/Core%20Humanitarian%20Standards/ENG_CHS_2024_RGB.pdf

- Stoddard, A., Harmer, A., & DiDomenico, V. (2009). Providing Aid in Insecure Environments: 2009 Update. Humanitarian Policy Group Report 34. London: Overseas Development Institute (ODI). Available at: https://media.odi.org/documents/4243.pdf

- UNDP (United Nations Development Program). (2022). UNDP GUIDANCE NOTE
- Private sector recovery and development in crisis and post-crisis settings. New York: UNDP. Available at: https://www.undp.org/sites/g/files/zskgke326/files/2023-11/private_sector_recovery_and_development_guidance.pdf

- United Nations Office for the Coordination of Humanitarian Affairs (OCHA). (2020). Global Humanitarian Overview. New York: OCHA. Available at: https://www.unocha.org/publications/report/world/global-humanitarian-overview-2024-enarfres

- USAID Bureau For Humanitarian Assistance (2022). Strategic Framework for Early Recovery, Risk Reduction, and Resilience (ER4), October 2022. Available at: https://www.usaid.gov/sites/default/files/2023-01/ER4_Framework-10.13.2022.pdf

# නීතිමය රාමු

- ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන වගන්තිය (මූලික අයිතිවාසිකම්)
- ශ්‍රී ලංකාවේ ජාතික ආපදා කළමනාකරණ ප්‍රතිපත්තිය (NDMP)
- ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (ශ්‍රී ලංකාව විසින් අනුමත කරන ලදී)
- ජාතික ළමා ආරක්ෂණ අධිකාරී පනත (1998 අංක 50)
- කාන්තාවන්ට එරෙහි විවිධ ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීමේ සම්මුතිය (CEDAW) (ශ්‍රී ලංකාව විසින් අනුමත කරන ලදී)
- 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනත
- ජිනීවා සම්මුතීන් (1949) සහ අතිරේක කෙටුම්පත්
- ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ (ICRC) මාර්ගෝපදේශ.
- මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (UDHR) (1948)
- සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය
- ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය
- ව්‍යාපාර සහ මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශක මූලධර්ම
- ශ්‍රී ලංකාවේ ආයතනික සමාජ වගකීම් පිළිබඳ ජාතික මාර්ගෝපදේශ
- මූලික මානුෂීය ප්‍රමිතිය
- Sphere ප්‍රමිතීන්
- මානුෂීය පසුබිම තුළ ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ අන්තර් ආයතනික ස්ථාවර කමිටු මාර්ගෝපදේශ
- මානසික සෞඛ්‍ය සහ මනෝ සමාජීය සහාය පිළිබඳ IASC මාර්ගෝපදේශ








DMC SRI LANKA

WFP World Food Programme

The Ceylon Chamber of Commerce